# ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව තුල විවාහය හා ලිංගික ජීවිතය පිළිබඳ පවතින ආකල්ප හා දැනුම පිළිබඳ සමීක්ෂණය.




වාර්තාව සකස්කිරීම: ඩබ්.උපුල් අනුර කුමාර

**( Master of social sciences university of kalaniya , B.a(Genaral) university of jayawardanapura, diploma in psychology counseling , productivity development officer & productivity trainer )**

## සමීක්ෂණයේ අරමුණ.

ආබාධ සහිත තරුණියන් පිළිබඳ තරුණයන්ගේ ආකල්ප හා ආබාධ සහිත තරුණියන්ගේ ආකල්ප පිලිබඳ සමීක්ෂණය සහ අධ්‍යනය වාතර්ාවක් එළිදැක්වීම.. (විවාහය,ලිංගික ජීවිතය ආබාධ සහිත කාන්තාව පිළිබඳ ඇති ආකල්ප )

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත ප්‍රජාව තුල විවාහ සිදුවීම නිරීක්ෂණය කලවිට පෙනී යන්නේ ඒවායින් බොහොමයක් ආබාධ සහිත පුද්ගලයන් අතරම සිදුවන බවයි.ඊට හේතුව වන්නේ සෙසු සමාජයේ නිසි පිළිගැනීමක් ආබාධ සහිත පුද්ගලයන්ට නොමැති වීමයි.මේ පිළිබඳව සත්‍ය තත්වය එළිදැක්වීම සඳහා කිසිදු පයෙර්ෂණයක් සිදුවී නොමැති අතර මෙම ක්‍රියාකාරකම හරහා එම අවශ්‍යතාවය සපුරාලන අතරම ආබාධ සහිත කාන්තාවන් සඳහා පොදු පිරිමි සමාජයේ දක්නට ලැබෙන ආකල්පමය ස්වභාවය සමාජගත කිරීමත් මෙහි අරමුණවේ.(මෙම සමීක්ෂණය සඳහා ආබාධ සහිත තරුණ තරුණියන් 50ක් සහ ආබාධ රහිත තරුණ තරුණියන් 50කගේ සහභාගිත්වයෙන් සිදු කෙරේ.)

## සමීක්ෂණයේ සමාජ විද්‍යාත්මක පැතිකඩ .

‘මිනිසා ජීවත්වන පරිසරයේ ඇති කිසියම් දෙයක් හෝ එහි සිදුවන කිසියම් සිදුවීමක් පිළිබඳව පරීක්ෂා කර කොට, ඒ පිළිබඳ වූ සියලුම ආනුභවික සාක්ෂි, තොරතුරු එක් රැස්කර, එම සාක්ෂි විශ්ලේෂණය කර බලා, එම දෙය එක් සංසිද්ධිය පිළිබඳ නිවැරදි නිගමනයකට එළඹීම සඳහා ක්‍රියාවට නගන සමස්ත වැඩසටහන’ සරළ ව ‘පර්යේෂණයක්’ (Research) ලෙෂ හැඳින්විය හැකිවේ.

ඒ අනුව මෙම සමීක්ෂණය සඳහා යොදාගෙන ඇත්තේ මානවවංශලේඛන ක්‍රමයයි . මෙහි දී සමාජ පර්යේෂකයා ට අවශ්‍යවන්නේ, සමාජමය ලෝකයෙ මානව චර්යාව හා සම්බන්ධ ප්‍රපංචල අර්ථය තේරුම් කරදෙමින්(Interpret), අවබෝධකර ගැනීම ට ය.

මේ සඳහා යොදාගෙන ඇත්තේ සමීක්ෂණ හෙවත් ප්‍රමාණාත්මක ක්‍රමවේදයයි.
පර්යේෂණයට ලක් කෙරෙන ප්‍රපංචවලට පර්යේෂකයාගේ බලපෑම හා මැදිහත්වීම අවමකොට, වාස්තවික ක්‍රම උපරිමයෙන යොදගෙන, පර්යේෂණය සිදු කළයුතු බව, එහි පිළිගැනීමවේ.

එසේම මෙම සමීක්ෂණය සඳහා යොදාගෙන ඇත්තේ ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රමයයි.ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රමය යනු
සමීක්ෂණක්‍රමය තුළ සංගහනයකින තෝරා ගන්නා නියෝජන සාම්පලයකට/නියදියකට අයත් දත්ත දායකයින්ගෙන ප්‍රමාණාත්මක දත්ත රැස්කරගෙන, එම දත්ත ප්‍රමාණාත්මක ව විශ්ලේෂණය කොට, නිගමනවලට එලඹේ. ම් සඳහා අවශ්‍ය ප්‍රමාණාත්මක දත්ත රැස්කර ගැනීමසඳහා පර්යේෂකයින් භාවිතා කරන ප්‍රධාන දත්ත රැස්කිරීමේ ශිල්පක්‍රමය(Data Collecting Technique) වන්නෙ ප්‍රශ්ණාවලි ක්‍රමයයි( Questionnaire) .

## සමීක්ෂණයේ නියැදිය තේරීම.

මෙම සමීක්ෂණයේ සංගහනය වන්නේ තරුණ ප්‍රජාවයි. එම සංගහනය යටතේ සසම්භාවී නියැදි තේරීමේ ක්‍රමවේදය යටතේ මෙම සමීක්ෂණයේ නියැදිය තෝරා තිබේ . සසම්භාවී යනු සමාන සම්භාවිතාවයක් සහිතව යනුවෙන් අර්ථ දැක්විය හැක. එහිදි පයෙර්ෂණ ගැටළුවට අදාල සංගහනයේ ජනගහනයේ ඕනෑම අයෙකුට එම නියැදියට ඇතුලත්වීමේ අවස්ථාව ලබාදෙමින් ඉන් කොටසක් පමණක් සමීක්ෂණය සඳහා

තෝරා ගනී.  මේ යටතේ නියැදි වගර් අතර තිබෙන පොකුරු නියැදි ක්‍රමය අදාල නියැදිය තේරීම සඳහා භාවිතා කර තිබේ. පොකුරු නියැදි ක්‍රමය යනු සංගහනය විශාල ප්‍රමාණයක එකක් වන අවස්ථාවලදි එයින් කුඩා ප්‍රමාණයක් තෝරා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රම වේදයයි.

මේ යටතේ තෝරාගනු ලැබූ නියැදිය සකස් කරනු ලැබූ ප්‍රශ්නාවලිය යටතේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරමින් මෙම සමීක්ෂණයේ දත්ත එක්රැස් කිරීම සිදුකර තිබේ.

එසේම මෙම සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය සිදුකර ඇත.

## තාරුණ්‍ය යනු .

තරුණ තරුණියන් යනු මානව සමාජයේ සිටින්නා වූ එක් ප්‍රවගර්යකි.ඔවුන් පිළිබඳව අපි සමාජ විද්‍යාත්මක දෘශ්‍යකෝණයෙන් බැලිය යුතුය.මෙම තරුණ තරුණියන් යනු මානව සමාජයේ සිටින කණ්ඩායමක් තවත් කණ්ඩායමක් හැදින්වීම ට යොදන නමකි.එය භාෂාමය ප්‍රවගර්යකි.

ළමා අවධිය පරිපූර්ණ භාවයෙන් වධර්නය වෙත්ම තරුණ තරුණියන් සමාජය තුළ තම අනන්‍යතාවය ගොඩ නගා ගැනීම ට උත්සාහ දරයි.ජීවිතයේ කුණාටු සමය තාරුණ්‍යය යි.සමාජ සමූහ වල යෞවනයන් තම ආධිපත්‍ය සෙවීම ට උත්සාහ දරයි.එහිදී ඔවුන් ට තම අනන්‍යතාවය සම්බන්ධ ගැටලු මතු වේ.තාරුණ්‍යය කුලය,වගර්ය,පන්තිය,ආගම,සදාචාරය හා සමාජ සන්දහර්ය තුළ වෙනස් වේ.ජීව විද්‍යාත්මක ලෙස ගැහැණු ළමයකු නම් ඔසප් වීම ආරම්භය ත් පිරිමි ළමයකු නම් ස්වජන මෝචනය,උගුරු ඇටය නෙරා ඒම සිදු වේ.

අප්‍රිකානු සමාජයේ මල්වර වූ විගස කාම සම්භෝගයේ යෙදීම ට සුදුසු කම් ලබයි.අප වැනි රටවල මෙම තත්වය වෙනස් වේ.අප සමාජ වල යෞවන කාලය දිගුය.බටහිර සමාජ වල ද යෞවන කාලය දිගුය.විවාහ වන වයස ද ඉහළ ය.කාම සම්භෝගයේ යෙදීම ට අමතර වෙනත් පිළිවෙත් ආයතන කරා යොමු වේ.ඉන්දියානු,අප්‍රිකානු සමාජ වල යෞවන කාලය කෙටිය.අතීත ඉන්දියාවේ මලබාර් වල ජීවත් වූ නාගර් වගර්යේ පුද්ගලයන් ට ප්‍රේම වන්තයන් ගනනාවක් සිටිය හකිය.

තාරුණ්‍යය යන්නට නිශ්චිත නිවර්චන නොමැත.නමුත් එය අවබෝධ කර ගැනීමට විවිධ අථර්කතන යොදා ගත හැකිය. ඒ අතර, එක්සත් සංවිධානය ට අනුව, අවුරුදු 15-24 ත් අතර වයස් කාණ්ඩයේ සිටින අය තරුණ තරුණියන් වේ. නමුත් ලංකාව වැනි රටවල මෙම තත්වය වෙනස් වේ.එය බොහෝ විට අවුරුදු 18 සිට පටන් ගනී.බටහිර රටවල සංස්කෘතික රටාව අනුව මෙම වයස් කාණ්ඩය 13-15 සිට ආරම්භ වේ. ලෝක බැංකුව ට අනුව, පුද්ගලයෙකු ගේ ජීවිතය ළදරු විය හා වැඩිහිටි විය අතර ඇති කාලය තාරුණ්‍යය ලෙස නිවර්චනය කර තිබේ.අවුරුදු 18-29 ත් අතර වයස් කාණ්ඩයේ සිටින අය තරුණ තරුණියන් ලෙස හඳුන්වා දී තිබේ. සාමාන්‍යයෙන් තරුණ විය යනු, වයස අවුරුදු 18-33 ත් අතර පවත්නා කාලයයි.

**තාරුණ්‍යයේ විශේෂ ලක්ෂණ**

- අවංක බව
- එඩිතර බව
- සාධාරණය වෙනුවෙන් සටන් කිරීම
- ආදරණීය බව
- කළබලකාරී බව
- කළහකාරී බව
- සහකම්පනය
- කේන්ති යාම
- විරැකියාව
- සුඛෝපභෝගී ජීවිත ගත කිරීම ට ඇති කැමැත්ත
- ආචාර ශීලී නොවීම

ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන පරිදි නව යොවුන් වියට එළඹෙන කාලය එනම් එම වයස් සීමාව යනු විශේෂයෙන්ම ශාරීරිකව මෙන්ම මානසිකව අභියෝග හා වෙනස් වීම් රාශියකට මුහුණ දෙනු ලබන අවධියකි. වැඩිහිටි වියට එළඹීමේ මුල්ම කාලය වන මේ කාලය තුළදී ද්විතික අධ්‍යාපනය ආරම්භ කිරීම, ඇතැම් විට නිවෙසින් පිටස්තරව ජීවත් වීමට පටන් ගැනීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය හෝ රැකියා ආරම්භ කරනු ලබන මූලික අවධිය වේ. බොහෝ දෙනෙකුට මේ කාලය අපුවර් හා සුන්දර අත්දැකීම් එකතු කරන අතරම තවත් බහුතරයකට මේ වෙනස් වීම දුෂ්කර වනු ඇත.

බොහෝ විට මෙය විශාද තත්වයක් උග්‍ර වීම හා තාරුණ්‍ය හා සබැඳි අභියෝග වලට මුහුණ දීමේදී ඔවුන්ට එල්ල වන ගැටලු වලට සමස්ත සමාජය විසින්ම දක්වන නොසැලකිල්ල මත සිදු වන්නක්. පවතින ආර්ථික, සමාජ හා සංස්කෘතික, තාක්ෂණික වටපිටාවන් මත පුද්ගල මානසික ජීවිතය සම්බන්ධව දක්වන අඩු වටිනාකම හා අවතක්සේරුව මේ තත්වයන් තව තවත් උග්‍ර කරමින් සිටියි.

ඒ අනුව ආබාධ සහිත පුද්ගලයින්ගේ තාරුණ්‍ය පිළිබඳ ඇති ආකල්ප ඉතා වැදගත් ස්ථානයක් ගනී. මන්ද ඔවුන්ද තාරුණ්‍ය හිමි පුරවැසියන් ලෙස ඒ සම්බන්ධයෙන් සමස්ථ සමාජය දක්වන්නා වූ ප්‍රතිචාර ඉතා වැදගත් වේ.

## <u>ලිංගිකත්වය යනු .</u>

ලිංගිකත්වය මිනිස් ජීවිතයේ අතිශය වැදගත් ඉසව්වකි. එය බෝහෝ දෙනා අර්ථකතනය කරන්නේ සමස්ථ පද්ධතියේ රදාපැවැත්මක් තිබෙන්නේ ලිංගිකත්වය මත බවයි. එය ඒක ශෛලියාගේ පැවැත්ම පරිණාමයේ ඉහලම හිනි පෙත්තේ සිටින මානවයා දක්වාම පොදු ක්‍රියා දාමයකි. බොහෝ සතුන් තම වගර්යා බෝ කිරීම සඳහා ලිංගිකත්වය යොදා ගත්තද මිනිසා එය භාවිතා කරන්නේ වගර්යා බෝ කිරීමට පමණක්ම නොවේ. නමුත් යුරෝපයේ හැරුනු විට ආසියාතික රටවල ලිංගිකත්වය පිළිබඳව විවෘතව කතා නොකරයි. එම නිසා බොහෝ විට එම රටවල් වල ජීවත් වන මිනිසුන් ලිංගිකත්වය පිළිබඳ එතරම් තෘප්තිමත් බවක් නොමැත.

ලිංගිකත්වය පිළිබඳ ලංකාව වැනි සමාජයක විවෘතව කතා නොකරන අතර අඹු සැමියන් අතර පවා ඒ පිළිබඳව සාකච්ඡා කරන්නේ නැත. එම නිසා ලිංගිකත්වය පිළිබඳව ඔවුන් අතරද ඇත්තේ අල්ප දැනුමකි. ලිංගිකත්වය ගත්විට අප දැනගත යුතු බොහෝ කරුණු කාරණා ඇත. සාමාන්‍යයෙන් ලිංගික ක්‍රියාකාරකම් ප්‍රධාන කොටස් 03ක් ඔස්සේ හඳුනාගත හැක.

01 සමාන්‍ය සංසගර්ය

02. මුඛ සංසගර්ය

03. ගුද සංසගර්ය

නමුත් බොහෝ දෙනා මින් දැන සිටින්නේ සාමාන්‍ය සංසගර්යන් පිළිබඳ පමණි. නමුත් අනෙක් ලිංගික සංසගර්යන්ද ලිංගිකත්වය තුල දක්නට ලැබේ.

නමුත් ඒවා පිළිබඳ දැන සිටින්නේ ස්වල්ප පිරිසක් පමණි. නැතිනම් ඇතැමුන් සිතා සිටින්නේ ඒවා අසාමාන්‍ය ලිංගික වයර්වන් බවයි. එය අප තුල පවතින නොදැනුවත්කම මිස වෙනත් කිසිවක් නොවේ. අප රට තුල බොහෝ විට පවුල් ප්‍රශ්ණ සහ අනියම් සබඳතා සීඝ්‍රයෙන් වධර්නය වන්නේ හුදෙක්ම මෙම ලිංගිකත්වය පිළිබඳ නොදැනීම නිසා බව බොහෝ පයෙර්ෂන වලින් පෙනී යයි.

ලිංගිකත්වය ගැන කතා කිරිමේදි එය පුළුල් වපසරියක් තුල විහිදී පැතිරේ. ලිංගිකත්වය මෙන්ම ලිංගික අක්‍රමතා සමාජය තුල බොහෝ දක්නට ලැබේ.

01. ලිංගික අපගමන
02. ලිංගික ආබාධ

ලෙස කොටස් දෙකකි.

**01. ලිංගික අපගමන ගත් විට**

- ප්‍රදශර්න කාමුකත්වය
- විරුද්ධ ලිංගික ඇදුම්වලට ඇති ආකශර්නය.
- දහර කාමුකත්වය
- පර පීඩිත ලිංගිකත්වය ආදි වශයෙන් දැක්විය හැකිය.

නමුත් මේවා අසාමාන්‍ය ලිංගික හැසිරීම් නොවේ. එය ඔවුන්ගේ එක්තරා මානසික මට්ටමකි. අප සමාජය තුල සමලිංගිකත්වය පිළිබඳවද පවතින්නේ දැඩි පිළිකුල් සහගත තත්වයකි. නමුත් එය යමෙකුගේ අභිංසක මානසික සතුටකි. එය අපට එසේ නොවේ යැයි විවේචනය කල නොහැක.

## 02. ලිංගික ආබාධ

ලිංගික ආබාධ ගත් විට පිරිමි පශර්වය තුල
ලිංගය ප්‍රාණවත් නොවීම,ක්ෂණික මෝචනය , තරලයක් ලෙස ධාතු පිට නොවීම ආදිය මූලික වශයෙන් හඳුනා ගත හැක.
ගැහැනුන්ගේ ලිංගික ආබාධ ගත් විට බොහෝවිට දක්නට ලැබෙන්නේ කන්‍යාබාවට පිළිබඳ ඇති බියයි.

ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ඇති රට වල මෙන්ම සමාජය තුලද බොහෝ ගැටුම් හා ප්‍රශ්ණ ඉතාමත් අඩුය. පවුල් ප්‍රශ්ණ තුල බෝහෝ විට පවතින්නේ පවුල් ප්‍රශ්නයක් නොව දීඝර්කාලීනව

පවතින ලිංගික ප්‍රශ්ණයක මූල බීජයකි. එම නිසා ලිංගිකත්වය යනු ඕනෑම පුද්ගලයෙකු හොඳින් අවබෝධ කරගත යුතු විෂය ක්ෂේත්‍රයකි.

## විවාහය යනු

විවාහය සමාජ, ආථර්ික, ආගමික පදනමක් මත ක්‍රියා කරන සංකල්පයකි. විවාහයන් වගර් වෙනස්ව දැකිය හැකිය.

පවුලක් නිමර්ාණය වන්නේ විවාහයෙන් පසුවය. පුරුෂයාට හා ස්ත්‍රියට නීතිමය වශවයන් ලිංගික එකතු වීමට ඇති අවසරය විවාහය මඟින් ලැබේ.

විවාහය යනු සංස්කෘතික ආගමික පදනමක් මත ක්‍රියාත්මක වන සංකල්පයකි. එබැවින් සමාජ ව්‍යුහය තුළ විවාහය කලින් කලට වෙනස් වේ. සාම්ප්‍රදායික සමාජයේ සිට නූතන සමාජය දක්වා එම සමාජයට ගැලපෙන ආකාරයෙන් විවාහයේ ස්වරූපය වෙනස් වී තිබේ. එබැවින් මානව ශිෂ්ටාචාරයේ ප්‍රධාන අදියර 3කට ගැලපෙන ආකායේ විවාහ ක්‍රම තුනක් පිළිබඳ ව ෙඩ්රික් ඒංගල්ස් සඳහන් කරයි.

1. වනචාර මිනිසාට සමූහ විවාහ

2. වැදි මිනිසාට ලිහිල් විවාහ

3. ශිෂ්ට මිනිසාට ඒක අඹු-සැමි විවාහ

ඒක අඹු-සැමි විවාහය මිනිසා අවුරුදු 3000 ක ඉතිහාසය තුළ ඉදිරියට තැබූ පියවරකි. ඕනෑම සමාජයක කවුරුන් අතර ලිංගික සම්බන්ධතා පැවතිය යුතු දැයි යන්න සමාජ පිළිගැනීමක් පවති. එය සමාජයේ විවාහ රීතීන් වශයෙන් හඳුන්වනු ලබයි. පිළිවෙලක් නොමැතිව සිදු වන ලිංගික සම්බන්ධතා මඟින් සමාජ පිළිවෙළ බිඳවැටීමටහේතුවේ. පවුලක් නිමර්ාණය වන්නේ විවාහය නිසාය.

ලිංගික අවශයතා මිනිසා සතු මානව අවශයතාවයකි. එය ක්‍රමවත්ව සහ සාමාජීය වශයෙන් පිළිගත් ආයතනයක් බවට පත්කිරීමේ අවශයතාව මත විවාහ සංස්ථාව ඇති විය. සමාජයක පැවැත්මට අවශය පුද්ගලයන් එම සමාජයට හඳුන්වා දෙන විධිමත් මාධ්‍යය විවාහයයි. එසේම අවිධිමත් ලිංගික සම්බන්ධතාවලින් සිදු වන හානිය අති මහත්ය. එයට හේතුව වන්නේ විවාහය මඟින් බිහි වන දරුවන් සමාජවේ සුජාත සහ නීතයානුකූල දරුවන් ලෙස සලකනු ලබයි. (අවජාතක දරුවන් වෙත සමාජ පිළිගැනීමක් ඇතිනොවේ.) පවුල් සංස්ථාව තුළ සුරක්ෂිතභාවයට නීතිමය පදනමක් සපයන්නේ විවාහය මඟිනි. එම නිසා විවාහය මඟින් ඉපදෙන දරුවන් යම් සමාජ සමූහයක හෝ ඥාති කණ්ඩායමක අයිතිවාසිකම්, උරුමකම් ලබා ගැනීමට හැකියාව ලැබේ. එම අයිතිවාසිකම්, උරුමකම් මුල්කොට ගෙන පරම්පරාවෙන් පරම්පරාවට දේපළ, නිලතල, පදවි නාම වැනි දේ ලැබේ.

විවිධ විවාහ වගර් සමාජ තුල දක්නය ලැබේ.

1. ඒකීය විවාහ

2. බහු විවාහ (බහු ස්ත්‍රී/ බහු පුරුෂ)

3. සමූහ විවාහ

4. සමලිංගික විවාහ

5. භූත විවාහ (හොල්මන් විවාහ)

විවිධ විවාහ වගර් රැසක් පවතින හෙයින් විවාහයට විශ්වීය නිවර්චනයක් සැපයිය නොහැකි වේ. විශ්වීය නිවර්චනයක් ඉදිරිපත් කළ නොහැකි වුවත් විවාහය විශ්වීය සමාජ සංස්ථාවකි. විවාහය මඟින් ආථර්ික හුවමාරු ක්‍රමයක් ක්‍රියාත්මක වේ. සරල සමාජවල මෙන් ම නූතන සංකීණර් සමාජවල විවාහය තුළ දෙපාශර්වයක් අතර ආථර්ිකමය හුවමාරු ක්‍රියාවලියක් දැකිය හැකි වේ. ආථර්ික හුවමාරු ක්‍රියාවලිය පෙන්නුම් කරන ප්‍රධාන සංකල්ප තුනක් ඇත.

1. අඹුමිල (Bride Price)

2. අඹුකමුව (Bride Service)

3. දෑවැද්ද

විවාහය වගර් තුනකි.

1. දීග විවාහය

ස්ත්‍රියක් සරණ පාවා දීම හෙවත් ස්වාමි පුරුෂයාගේ නිවසට ඇය කැන්දාගෙන යාම දීග විවාහය යි.

2. බින්න විවාහය

පුරුෂයා ස්වකීය නිවසින් වෙන්ව ගොස් භායර්ාවගේ නිවසෙහි පදිංචියට යාමෙන් සිදු කරන විවාහය බින්න විවාහයයි. සාම්ප්‍රදායික සමාජයෙ ඉඩම් නොමැති, අතිරික්ත පිරිමින් ඇති පවුලක පිරිමියකු හා අතිරික්ත ඉඩම් ඇති, පිරිමින් නොමැති පවුලක කාන්තාවක් සමඟ මෙම විවාහ ක්‍රමය පැවතිනි.

3. නෑනා මස්සිනා විවාහය

විවාහය, ඇවැස්ස ඥාතීන් අතර පිළිගත් චාරිත්‍රානුකූල, අනුමත විවාහ රටාව විය. විවාහය සිදු වූවේ හරස් ඥාතීන් අතර පමණි. හරස් ඥාතීන් යනු, නෑකමට සහෝදර සහොදරියන් නොවන අයයි. නෑනා, මස්සිනා විවාහය එවැන්නකි. එය සමාජයේ පිළිගැනීමට ලක් විය.

## සමීක්ෂණයේ අන්තර්ගතය විග්‍රහ කිරීම.

මෙම සමීක්ෂණය සඳහා තරුණ ප්‍රජාව 100 දෙනෙකුගේ නියැදියක් සම්බන්ධකරගත් අතර ඔවුන් පහත පරිදි කාණ්ඩකර දැක්විය හැක .


01 ආබාධ සහිත නොවන තරුණියන් 22

02. ආබාධ සහිත තරුණියන් 28

03. ආබාධ සහිත නොවන තරුණයින් 29


04 ආබාධ සහිත තරුණයින් 22

එම තරුණ තරුණියන් 100 දෙනා වයස අවු 15 ත් 39 ත් අතර පරාසයක අයයි. එය පහත අයුරින් විශ්ලේෂණය කල හැක.




ඉන් 71 දෙනෙකුම වයස ඉඅවුරුදු 30 ට අඩු තරුණ තරුණියන්ය . 29 දෙනෙකු වයස අවුරුදු 31 ත් 39 අතර අය වෙති .

එබැවින් තාරුණ්‍ය පිළිබඳ ඇති නිවර්චනයන්ට අනුව මෙම නියැදිය තුලින් අනාවරණය වී ඇති අදහස් නියම තාරුණ්‍යයේ අදහස් බවට අපට නිගමනය කල හැක .





එසේම මෙම නියැදියේ සිටින 67 දෙනෙකුම අවිවාහක අයයි. එය මෙම සමීක්ෂණයේ අරමුණු ලගාකරගැනීම සඳහා වඩා වැදගත් කරුණකි. මන්ද ඔවුන් ලිංගිකත්වය හා විවාහ ජීවිතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් නොමැති එය අපේක්ෂාවෙන් සිටින පිරිසක් බැවිනි.

එසේම ඉතිරි 33 දෙනාගේ ප්‍රතිචාර විශ්ලේෂණය තුලින් මෙම අවිවාහක පිරිස විසින් ඉදිරිපත් කරනු ලබන මතය ප්‍රායෝගිකව සත්‍යක්ද යන්න නිගමනය කල හැක.


## <u>අධ්‍යාපනය</u>

මෙම නියැදියේ අධ්‍යාපනය සලකා බැලූවිට 74.7% ක්ම අ:පො:ස:(සා:පෙල) මට්ටමින් ඉහලට අධ්‍යාපනය හදාරා ඇත. ඒ අනුව මෙම සමීක්ෂණයේ අරමුණු සඳහා අධ්‍යාපනයේ බලපෑම කොතෙක් දුරට ඉවහල් වන්නේද යන්න ඉදිරියේ මනාව විග්‍රහකිරීමට හැකි වනු ඇත.



**<u>ආබාධ සහිත තරුණියන්  සඳහා පමණක් අදාල වූ කොටස.</u>**

**1. ඔබ විවාහ වීමට අපේක්ෂා කරන්නේ හෝ විවාහ වී සිටින්නේ කෙබඳු තරුණයෙකු සමඟ ද?**




මෙම ප්‍රශ්ණය සඳහා ප්‍රතිචාර දක්වා ඇති පිරිස 28 දෙනෙක් වන අතර එයින් 53.6 % ක්ම ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් විවාහ වීමට කැමැත්ත ඇත්තේ ආබාධ සහිත නොවන පිරිමියෙකු සමග යන්නයි. ( එම ප්‍රතිශතය ප්‍රතිචාරකයින් වශයෙන් ගත්කල 15 දෙනෙකි)

මින් 09 දෙනෙකුම මේ වන විට විවාහ වී ඇති අයයි. 06 දෙනෙකු අවිවාහක අය වේ.

මෙම 15 දෙනාගෙන් 14 දෙනෙකුම අ:පො(සා:පෙළ) දක්වා අධ්‍යාපනය ලැබූ අයයි.

( මෙය තාරුණයේ ලක්ෂණයක් වන උසස් ජීවන මට්ටමක් ලගාකරගැනීමට ඇති කැමැත්ත, තකර්ාණුකූල බව පිළිබඳ නිගමනය කලහැකි කරුණකි.)

මේ හා සම්බන්ධවන අනෙක් සම්බන්ධිත ප්‍රශ්ණය වන්නේ

**02. ඔබ ආබාධ සහිත  තරුණයෙකු විවාහය සඳහා තෝරානොගන්නේ නම් ඊට හේතු දක්වන්න.**

මේ සඳහා ප්‍රතිචාරකයින් 15 දෙනෙකු පිළිතුරු ලබා දී ඇත. ප්‍රතිශතයක් ලෙස එය 53.5% කි.

මෙම පිළිතුරු තුල විවාහයේ මූලික පරමාථර්යක් වන ආරක්ෂාව හා රැකවරණය ,ආථර්ික සුරක්ෂිත භාවය, සහයෝගය , ආදණිය බව යන කාරණා පිළබඳ ඔවුන් දැඩි අවධානයක් යොමුකරණ බව නිගමනය කල හැක.

10.7%ක් ප්‍රකාශකර ඇත්තේ ආබාධ සහිත තරුණයෙකු සමග විවාහ වීමට කැමති බවයි. මෙහිදී ඔවුන් තමන්ගේ අබාධ සහිත භාවය සාධාරණීකරණයට ලක් කරමින් ගැටුම් වලින් තොර විවාහ ජීවිතයක් හා

ලිංගික ජීවිතයක් අපේක්ෂාකර තිබේ. ඒ බව ඔවුන් ඔබ ආබාධ සහිත තරුණයෙකු විවාහය සඳහා තෝරා ගන්නේ නම් ඊට හේතු දක්වන්න යන ප්‍රශ්නයට ලබා දී ඇති ප්‍රතිචාර තුලින් නිගමනය කල හැක. ඒ තුල තරුණයේ ඇති සහකම්පනය , සාධාරණ බව , ආදරණිය බව යන ලක්ෂණ පිලිබිඹු කරයි.

උදා:

- අප දෙදෙනාම ආබාධ සහිත නිසා දෙදෙනාට දෙදෙනා ගොඩක් ආදරෙයි හිත රිද්දන්නේ නෑ
- දෙදෙනාම සමාන ආබාධ නිසා දෙදෙනා අතර ගැටුම අඩුයි.හිත සතුටුයි
- මා සිටින තත්වය පිළිබඳ ඔහුටද අවබෝධයක් තිබීම නිසා ගැටුම් වලින් තොර ලිංගික ජීවිතයක් ගත කල හැකි වීම නිසා එය මානසික සහනයක් වීම.

### 03.එසේ නැත්නම් ඊට හේතු

මෙම ප්‍රශ්නය සඳහා 15 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇති අතර එය පහත පරිදි විශ්ලේෂණය කල හැක.

| හේතුව | ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| ආථරීකමය හේතු | 09 |
| පෞද්ගලික හේතු | 13 |
| ප්‍රවේශය පිළබඳ හේතු | 02 |

මෙම විග්‍රහයට අනුව පෙනී යන්නේ තම පෞද්ගලික හේතූන් මත ආබාධ සහිත පුද්ගලයෙකු විවාහ කරගැනීමට ආබාධ සහිත කාන්තාවන් අකමැති බවයි.

35.7% ක් ප්‍රකාශ කර ඇත්තේ විවාහවීමට අපේක්ෂාවක් නොමැති බවයි. ඒ සඳහා ඔවුන් හේතු ලෙස දක්වා තිබෙන්නේ තමා නිසා අන් අය අපහසුතාවයට පත්වේ යැයි යන මතයයි.

උදා: .

- මාගේ ආබාධ සහිත භාවය නිසා ඔහු සමාජය ඉදිරියේ හැල්ලුවට ලක් වීම
- තමා වැනි අයෙක් විවාහ කර ගැනීම ඔහුගේ මුළු ජීවිතයටම බරක් ,කරදරයක් ලෙස සිතීම

( මෙම නියැදියේ 89.3%ක් විවාහයට හා ලිංගික ජීවිතයට කැමැත්ත ඇති බව නිගමනය කල හැක. )

### 04.ඔබ ආබාධ රහිත තරුණයෙකු විවාහය සඳහා තෝරා ගන්නේ නම් ඊට හේතු දක්වන්න.

මේ සඳහා සම්පූණර් නියැදියෙන් පුද්ගලයින් 11 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත . ඒවා පහත අයුරින් වෙන්කොට දැක්විය හැක.

| හේතුව | ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| ආථරීකමය හේතු | 04 |
| පෞද්ගලික හේතු | 12 |
| ප්‍රවේශය පිළබඳ හේතු | 01 |
| ආරක්ෂාව පිළිබඳ හේතු | 06 |

**5. ආබාධ රහිත තරුණයෙකු ඔබ සමඟ විවාහ නොවීමට ඇති හේතු දක්වන්න.**

ඉහත ප්‍රශ්ණය සදහා පිළිතුරු සපයා ඇත්තේ මෙම නියැදියෙන් 18 දෙනෙකු පමණි. එය ප්‍රතිශතයක් ලෙස ගත් කල 64.28% ලෙස ගතහැක .

මේ සදහා ලබා දී ඇති පිළිතුරු වලින් ගම්‍ය වන ප්‍රධාන කාරණාව වන්නේ ආබාධ සහිත භාවය පිළිබද සමාජය තුල මුල්බැසගෙන ඇති සාම්ප්‍රදායික ආකල්ප පිළිබද නිගමනයකි.


ඒ බව පහත පිළිතුරු වලින් නිගමනය කල හැක.

උදා :

- මාගේ ආබාධ සහිත භාවය නිසා ඔහු සමාජය ඉදිරියේ හැල්ලුවට ලක් වීම
- පවුලේ සාමජිකයන්ට ලැජ්ජාවක් අවනම්බුවක් වේ යැයි සිතා
- මම වලනාබාධ සහිත කෙනෙක් නිසා මගේ කටයුතු කිරීමට ඔහු හෝ වෙනත් අයෙක් මා වෙනුවෙන්ම සිටිය යුතු නිසා ඔහුගේ කාලය, ධනය වැය වීම නිසා
- පවුලේ ගෞරවයට හානි වෙයි කියලා හිතන නිසා
- ඔහුගේ පවුලේ නෑදෑයන්ට හදුන්වාදීම අපහසු නිසා

( මෙම තත්වය සමාජවිද්‍යානුකූලව ගත් කල අනෝමීයත්වය සහ සමාජ හුවමාරු න්‍යාය පිලිබිඹු වන අවස්ථාවකි . ඒ අනුව සමාජය තුල ඇති නොයෙකුත් සම්බන්ධතා ගොඩනැගී ඇති අකාරය අනුව පුද්ගලයාට ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව උදාවේ මෙහිදී වාසි හා අවාසි යන කාරණා දෙක සදහාම මෙය බලපායි. එසේම විවිධ සංස්කෘතික කාරණා නිසා පුද්ගලයාට අරමුණු හබායෑමට බාධා පැමිණේ. )

**6. ඔබ ආබාධ රහිත තරුණයෙකු සමඟ ප්‍රේම සබඳතාවක් පවත්වා තිබේද? එය අතර මඟ නැවතුණි නම් ඊට හේතු මොනවා ද?**




උදා :

- ඔව්,ඔහු ආත්මාර්ථකාමී පුද්ගලයෙකු නිසා
- ඔව්,තමා කියපු සමහර දේවල් ඔහුට නොතේරුණු නිසා ප්‍රශ්න ඇති වුණා
- ඔව්,ආබාධිත තත්වය නිසා ඔහුගේ දෙමාපියන්ගෙන් විවිධ බලපෑම් එල්ල වීම
- ඔව්, ඔහු මත් පැන් වලට ඇබ්බැහි වී සිටි නිසා එයට තමා අකමැති සහ එය තම ඉදිරි අනාගතයේදී ආර්ථික ගැටලු රාශියකට මුහුණ දීමට හේතුවන නිසා එය නවත්වා ඇත.
- ඔව්,මගේ තත්වය බොහොම විට ඔහුගේ පවුලේ අයට ලැජ්ජාවට කරුණක් වීම
- ඔව්

( මෙම පිළිතුරු ලබාදීමේ ප්‍රතිශතය තුලින්ම පෙනි යන කරුණක් වන්නේ ආබාධ සහිත ප්‍රජාව ආබාධ සහිත නොවන ප්‍රජාව සමග අන්තකර්රණයේදී ඇති ගැටළුවයි. එසේම තාරුණයේ ලක්ෂණයක් වන සෘජු තීරණ ගැනීමේ ලක්ෂණයද , අසාධාරණයට එරෙහිව කටයුතු කිරීමේ ලක්ෂණයද ගම්‍ය වේ.)

**7. ඔබ දන්නා  ආබාධ සහිත තරුණියක් ආබාධ රහිත අයකු හා විවාහ වී සිටී ද?(විවාහයට පසුව ආබාධිත වීම අදාල නොවේ)**




මෙම ප්‍රතිචාර දැක්වීමට අදාලව එලබිය හැකි නිගමනය වන්නේ ආබාධ සහිත කාන්තාවන්ගෙන් වැඩි ප්‍රතිශතයකට ( 60.9%) ආබාධ සහිත නොවන පිරිමියෙකු හා විවාහ වීමට ඇති හැකියාව හා අවස්ථාව පිළබඳ අවබෝධයක් ඇති බවය .

නමුත් 39.1% ක ප්‍රතිශතයකට ඒ පිළිබඳ දන්නා සිද්ධි නොමැති වුවත් එම ප්‍රතිශතයෙන් 66.6 % ක්ම විවාහ වීමට කැමැත්ත ප්‍රකාශකර තිබෙන්නේ ආබාධ සහිත නොවන පිරිමියෙකු සමගය. එයින් එලබිය හැකි නිගමනය වන්නේ ආබාධ සහිත කාන්තාවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ආබාධ සහිත නොවන පිරිමින් හා විවාහ වීමට කැමැත්තක් දක්වන බවය.

**08. ආබාධ නොමැති තරුණයෙකු හා විවාහ වීමේ දී ඇති විය හැකි අවාසි මොනවා ද?**

මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දී ඇති ප්‍රතිචාරකයින් සංඛ්‍යාව 18 දෙනෙකි. එය ආබාධ සහිත කාන්තාවන්ගේ නියැදියෙන් 64.28% ක ප්‍රතිශතයකි.

මෙහිදි ඔවුන් විසින් සපයා ඇති පිළිතුරු විශ්ලේෂණයේ පහසුව සඳහා ප්‍රධාන කොටස් 02 යටතේ හඳුනාගනු ලැබේ .


01. ආබාධ සහිත යුවලකට පමණක් මුහුණපාන්නට සිදු වන අවාසි
02. ආබාධ සහිත නොවන යුවලකකට මුහුණපාන්නට සිදුවන අවාසි

| ආබාධ සහිත යුවලකට පමණක් මුහුණපාන්නට සිදු වන අවාසි | ආබාධ සහිත නොවන යුවලකකටත් මුහුණපාන්නට සිදුවන අවාසි |
|---|---|
| ඇතැම් විට මගේ බැරිකම සහ අපහසුතා තේරුම් ගැනීම ඔහුට තරමක් දුෂ්කර වීම නිසා රණ්ඩු සරුවල් ඇති වීම | නිතරම ඔහු හා තමා සමාජය් ඉදිරියේ විවේචනයට ලක්වීම |
| ඇතැම් විට ඔහුට තමාගේ තත්වය හා අපහසුතා තේරුම් ගැනීමට නොහැකි වීම නිසා ගැටළු ඇති වේ | දෙදෙනාම මානසික පීඩනයකට ලක්වීම |
| ඔහු යන සෑම තැනකම මා සමගම යා නොහැකි නිසා දුරස්ථ බවක් ඇති වීම නිසා මා හුදකලා වීම | තමාට වඩා ගැලපෙන අයෙක් වෙත ඇදී යාමට ඇති හැකියාව වැඩිවීම |
| එයාට කන ඇහෙන නිසා කතා කරන්න පුලුවන් නිසා සමහර විට එයා වෙනත් කෙනෙක් එක්ක යාලු වෙන්න පුලුවන් | ඔහුට නිදහසේ විවේකය ගත කිරීමට ඇති කාලය තමන් වෙනුවෙන් හා දරුවාගේ කටයුතු සදහා යෙදවීමට සිදුවන නිසා අඩදබර ඇති වීම. |
| තම ආබාධ සහිත භාවය හරිහැටි තේරුම් නොගැනීම නිසා විවාහ ජීවිතයේ ලිංගික ගැටළු ඇති විය හැක. | ආර්ථික ගැටළු |
| විවිධ උත්සව වලට තමාව කැඳවීමට ඇති අකමැත්ත නිසා තමාව කොන් කිරීම නිසා තමා මානසික පීඩාවකට ලක් වීම් | පවුලේ සාමාජිකයන්ගේ අඩමත්තේට්ටම් ඇති වීම |
| තමාට තනිව එහා මෙහා යෑමට නොහැකි නිසා ඔහු තම නිදහස අයුතු ලෙස යොදාගැනීම | මානසික නිදහස නැතිවීම |
| ඔහු නිතර තමා නිවසේ දමා ඔහුට අවශ්‍ය තැන් වල යාම නිසා තමා නිවසේ තනි වීම | ගෙදර නිතර රණ්ඩු ඇති වීම |
| | නෑදෑයන්යාළුවන් එන තැන් වලට තමා එනවට අකමැති නිසා මට දුක හිතෙයි |
| | මගේ විවාහය කැඩෙන්න පුළුවන් |
| | ඔහුගේ පවුලේ අය විසින් තමාව හැල්ලුවට ලක් කිරීම |
| | දෙදෙනාගේ මානසික තත්ව වල වෙනස් කම නිසා ගැටුම් ඇති වීම |
| | වෙනත් කාන්තාවන් ඇසුරට,මත්පැනට,වෙනත් වෙනත් දේට ඇබ්බැහි වීම නිසා තමා හුදෙකලා වී මානසික පීඩනයට ලක් වීම |
| | නිතර ගැටුම් ඇති වීම |

මෙම විශ්ලේෂණයේදි පෙනී යන්නේ බොහෝ කාරණා විවාහ ජීවිතයට පොදු ගැටළුකාරී තත්වයන් බවයි.


ආබාධ සහිතභාවය නිසාම ඇති වන අපහසුතා 08 න් කරුණු 05කටම පදනම වී ඇත්තේ ප්‍රවේශ පහසුකම් පිළිබඳ ගැටළුවයි. එය ආබාධ සහිත භාවයේ හෝ ආබාධ සහිත කාන්තාවන්ගේ ගැටළුවක් නොව පවතින ක්‍රමයේ ගැටළුවකි.

**9. ඔබගේ ආබාධිත බව ආබාධිත නොවූ තරුණයෙකු හා විවාහ වීමට නුසුදුසු කමක් සේ සලකනවා ද?**





මෙම ප්‍රතිචාරයන්ගේ නිගමනය වන්නේ ආබාධ සහිත කාන්තාවන් සමාජය තුල අන්තකර්රණය වීමට සුදානම් නමුත් ඔවුන්ට ඒ සදහා අවස්තාවන් දුලභ බවයි.

**10. ඔබේ පවුලේ අය හා සමීපතමයන් ඔබට විවාහ යෝජනා ගෙන ආවේ ද**




11. ඔබට කරන ලද විවාහ යෝජනා අතර ආබාධිත නොවන තරුණයින් සිටියේ ද?





මෙම දත්තයන් දෙක සංසන්දනය කර බැලීමේදි එලබිය හැකි නිගමනය වන්නේ සමාජය තුල පවුල තුල ආබාධ සහිත කාන්තාවන් විවාහ කරදීමට කටයුතු කරනු ලැබුවද එය බොහෝ අවස්ථාවල තවත් ආබාධ සහිත පරිමියෙකු සමග බවයි. මෙයට හේතු සාධක වී ඇත්තේ ශ්‍රී ලංකාවේ විවාහ ක්‍රමය තුල දක්නට ලැබෙන සාම්ප්‍රදායික මතවාද හා ක්‍රමවේද වේ. මේ තුල ආබාධ සහිත කාන්තාවන්ට පමණක් නොව ආබාධ සහිත නොවන කාන්තාවන්ට පවා දැඩි අපහසුතාවන්ට මුහුණපෑමට සිදු වී ඇත. උදා: දෑවැදි සංලකල්පය, කුලය ,ගෝත්‍රය , පන්තිය , ධනය, බලය වැනි කාරණා ශ්‍රී ලාංකික විවාහ ක්‍රමය තුල ප්‍රබල සාධක බවට පත් වී ඇති බව ඒ පිළිබඳ සමාජ විද්‍යාත්මකව විමසාබැලීමේදි නිගමනය කල හැක.

## ආබාධ සහිත තරුණයින් තුල ඇති ආබාධ සහිත නොවන තරුණියන් පිළිබඳ ඇති ආකල්ප

1. ඔබ ආබාධ සහිත නොවන තරුණියක් හෝ කිහිප දෙනෙකු හඳුනනවා ද?




2. ඔබ ආබාධ සහිත නොවන තරුණියක සමීප ව ඇසුරු කර තිබේ ද?




මෙම ප්‍රශ්ණයට ලබා දී ඇති ප්‍රතිචාරවල ප්‍රතිශතය ගත් කල ඔව් යන පිළිතුර ලබා දී ඇති පිරිස 86.4 % කි.

නමුත් ආබාධ සහිත නොවන තරුණියන්ගෙන් මෙම ප්‍රශ්ණය විමසූ විට 81.8 % ක් ප්‍රකාශ කර ඇත්තේ නැත යන පිළිතුරයි.

## 03.ඔබ ආබාධ සහිත නොවන තරුණියක් පිළිබඳ කෙදිනක හෝ ප්‍රේමණීය හැඟීමක් ඇතිවී තිබේ ද?




මෙම නියැදියේ සිටින ආබාධ සහිත තරුණයින් ඔව් යන පිළිතුර ලබාදීම 100% ක් වුවත් ආබාධ සහිත නොවන තරුණියන් ලබා දී ඇති පිළිතුර වන්නේ නැත යන්නයි. එය ප්‍රතිශතයක් ලෙස ගත්කල 100 % කි.මෙය යම් ආකාරයකට සමාජය තුල පවතින යම් විෂමතාවයක් ලෙස නිවර්චනය කල හැක.


## 04.ආබාධ සහිත නොවන තරුණියක් ආබාධ සහිත තරුණයෙකු හා විවාහ වීමෙන් සිදු විය හැකි අවාසි මොනවා ද?

මෙම ප්‍රශ්නය සදහා ආබාධ සහිත තරුණයන්ගේ නියැදියෙන් 100% ක් ප්‍රතිචාර දක්වා ඇත. එම පිළිතුරු සියල්ලම තුල 100% අන්තගර්ත වී ඇත්තේ අබාධ සහිත නොවන තරුණියක් විවාහකර ගැනීමෙන් ඇයට අත්වන අවාසි තත්වයන් පිළිබදවය. කිසිදු තරුණයෙකු එය අවාසියට කරුණක් නොවන බවට අදහස් පලකර නොමැත.

එසේ දක්වා ඇති අවාසි සහගත තත්වයන් පහත පරිදි වගර්කර දැක්විය හැක.

| අංශය | ප්‍රතිචාර අකවා ඇති සංඛ්‍යාව |
|---|---|
| එදිනෙදා කටයුතු වලදි සිදු වන අවාසි | 04 |
| ප්‍රවේශ පහසුකම් වලදි සිදු වන අවාසි | 00 |
| ආථර්කකටයුතුවලදි සිදු වන අවාසි | 02 |
| දරුවන් බිහිකිරීමේදි සිදු වන අවාසි | 03 |
| ආරක්ෂාව සම්බන්ධයෙන් සිදු වන අවාසි | 02 |
| සමාජීය වශයෙන් සිදු වන අවාසි | 09 |
| ලිංගිකත්වය සම්බන්ධයෙන් සිදුවන අවාසි | 02 |

**5. ආබාධ සහිත නොවන තරුණියක් විවාහ කර ගැනීමෙන් සිදු විය හැකි තත්වයන් පහත පරිදි වේ. ඔබගේ එකඟතාවය පල කරන්න**




මෙහි වැඩිපිරිසක් පල කර ඇති අදහස වන්නේ ආබාධ සහිත තරුණියක් විවාහ කරගැනීමෙන් ආබාධ සහිත දරුවන් බිහි වීමට ඇති ඉඩ ප්‍රස්ථාව වැඩි බවයි. එය සම්පූර්ණ නියැදියෙන් 70.06 %ක් තරම් විශාල අගයකි.

- එසේම පවුලේ ගෞරවයට හානි පැමිණෙ යැයි 58.8 % ක් සඳහන්කර තිබේ.
- එසේම ඇයව රැකබලා ගැනීම වෙනමම කායර්ක් වන බව 23.5 % ක් ප්‍රකාශකර ඇත.
- තවද ලිංගික ජීවිතය අතෘප්තිකර එකක් වන බව 11.8 % ක් ප්‍රකාශකර ඇත.

**6. ආබාධ සහිත තරුණයන් ශ්‍රී ලංකා සමාජය තුලට අන්තර්කරණය කිරීමට හා ඔවුන්ට වඩාත් හොඳ පිළිගැනීමක් ලබා දීමට ඔබ විසින් කරන යෝජනා කවරේ ද?**

| අනතර්කරණ යෝජනා | අන්තර්කරණයට අදාල නොවන යෝජනා |
|---|---|
| ස්වයං රැකියා අවස්ථාවන් හදුන්වාදීම තුලින් ඔවුන්ව සමාජගත කිරීම සිදුකල හැක | නොදනී |
| සමිති සමාගම් හරහා ඔවුනට සමාජයගේ ඇති අයිතීන් දිනා ගැනීමට හැකි වනු ඇත | අදහසක් නොමැත |
| නිසි අධ්‍යාපන ක්‍රමයක් හදුන්වාදීම | |
| සැමට සමානාත්මතාවය තිබිය යුතුයි (ආබාධිත පාසල් යැයි වෙන් කිරීම අවම කල යුතුයි) | |
| ආබාධ සහිත කෙනෙක් සමාජයට බරක් නොවී ජීවත්වෙනවා කියන එක ඇගයීමට | |

| | |
|---|---|
| ලක් කිරීම තුලින් සමාජය තුල අන්තර් කරනය කල යුතුයි | |
| ඔවුන්ගේ තිබෙන හැකියාවන් එලියට ගැනීම තුලින් කොන් වී සිටින ආබාධ සහිත තරුණයන් සදහා හොද පිලිගැනීමක් ගත හැකිය | |
| ආබාධ සහිත කෙනෙක් සමාජයට බරක් නොවී යැපෙන්නෙක් නොවි ජීවත් වන්නෙ කොහොමද , යන ප්‍රශ්නය නිරාකරනය කිරීම තුලින් හොද පිලිගැනීමක් ලබා ගත හැකි වේ | |
| නව රැකියා අවස්ථා හදුන්වා දීම තුලින් අන්තර් කරණය සිදුකෙරේ | |
| ස්වයං රැකියා මත පමණක් සීමා නොවී ඔවුන්ද සමාජය තුල නව රැකියා වලට අයදුම්කිරීමට අවස්ථාව ලබාදීම | |
| ඔවුන්ව ගෙවල්වල හිරකරගෙන සිටින ඔවුන්ගේ බාරකරුවන් හට වෙනම දේශනයක් ලබාදී ඔවුන්ව සමාජය තුලට නිරාවරණය කල යුතුයි | |
| ඔවුන් සදහා වෙන් කර ඇති විශේෂිත පාසල් හා ඔවුන්ව විශේෂ යැයි හදුන්වාදෙන මතය නැවැත් වීම තුලින් ඔවුන්ට ඇති ලැජ්ජාව බිය යන දේ දුරු වී ඔවුනද සමාජයේ සාමාන්‍යය පුරවැසියන් ලෙස ජීවත් වීමට පුලුවන. | |
| ඔවුන්ව සමාජය තුලට නිරාවරණය කලයුතුයි | |
| යැපෙන මානසිකත්වය ඔවුන් තුලින් ඉවත් කිරීම තුලින් සමාජයේ හොද පිලිගැනීමක් ලබාගත හැකිය | |
| ගෝලීය මුලධර්ම ශ්‍රී ලංකාවට අනුගතකර ගැනීම තුලින් | |
| ආබාධ සහිත කෙනෙක් සමාජයට බරක් නොවී ජීවත් වෙන්වා කියන එකම ඇගයීමට ලක්කිරීම තුලින් සමාජය තුල අන්තකර්රණය කල හැකිය | |
| ඔවුන්ව විශේෂයැයි සලකා කටයුතු නොකිරීම | |
| | |

මේ සදහා පිළිතුරු ලබා දී ඇති පිරිස විසින් ලබා දී ඇති ප්‍රතිචාර වලින් දෙදෙනෙකු හැරෙන්නට අනෙක් සියළුම යෝජනා අන්තකර්රණ යෝජනා වන අතර එය 90.90 % ක් ලෙස සදහන් වේ.

මෙයින් නිගමනය කල හැක්කේ අන්තකර්රණය පිළිබද ආබාධ සහිත තරුණයින් තුල හොද දැනුමක් පවතින බවයි.

7. **ආබාධ සහිත තරුණයන් පිළිබඳ ලාංකික තරුණියන්ගේ ආකල්ප කෙබඳුදැයි ඔබට කෙටියෙන් කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ නියැදිය වන තරුණියන් 22 නාගෙන් 21 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 95.45 % කි.

ඒ අතරින් ලාංකික තරුණියන් තුල ආබාධ සහිතතරුණයින් පිළිබඳ ධනාත්මක ආකලපයක් ඇතැයි විශ්වාස කොට පිළිතුරු ලබාදී ඇත්තේ පුද්ගලයින් 03 දෙනෙකු පමණි. එය ප්‍රතිචාර දැක් වූ පුද්ගලයින්ගෙන් 14.28 %ක ප්‍රතිශතයකි.

උදා:

- ලාංකික තරුණියන්ගෙන් කොටසක් අබාධිත තරුණියන් ප්‍රතික්ෂේප කලත්, තරුණයින් ඔවුන්ට එක සේ සලකයි
- බහුතර තරුණියන් තුල ආදරයක් තියෙනවා(අනුකම්පාවක් නොව) අබාධ සහිත කෙනෙක්ව (සමාජ ගත වී සිටීම) හොඳ අනාගතයක් තියෙනවා

**ඉතිරි අය සියළුදෙනාගේ ප්‍රකාශ කර ඇත්තේ ආබාධ සහිත තරුණයින් පිළබඳ තරණියන් තුල ඇත්තේ සෘණාත්මක ආකල්පයක් බවයි.**

උදා :

- කිසිදු ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට බැරි අප්‍රසන්න ජන කොටසකි
- කිසිම දෙයක් කරගැනීමට නොහැකි කොටසක් ලෙස හංවඩු ගැසීම
- ආ:ස තරුණයන් හට මිලමුදල් යහමින් තිබෙන පවුල් වලට සම්බන්ධවී ඔවුන්ගේ ධනය හුරාකාමින් පසුව ඔවුන්ව රවටටන්න පෙලඹී සිටි

8. **ආදරණීය සහකාරියක ඔබ සොයන්නේ නම් වැඩි වශයෙන් සලකා බැලීමට කැමති විශේෂිත ආබාධිත වර්ග තිබේ ද?ඒ මොනවා ද?**

මේ පිළබඳ තරුණියන් 22 ක් ප්‍රතිචාර දක්වා ඇත. එය සම්පූර්ණ නියැදියෙන් 100 %ක ප්‍රතිශතයකි. එසේ දක්වන ලද ප්‍රතිචාර මෙසේ දැක්විය හැක.

| ආබාධ සහිත භාවය | ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| අදහසක් නොමැත | 03 |
| විශේෂයක් නොමැත | 18 |
| ශ්‍රවනාබාධ | 01 |

මෙහි වැඩිපිරිසක් ප්‍රකාශකර ඇත්තේ විශේෂයක් නොමැති බවයි.

**9. ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ සාමාජීය හෝ සංස්කෘතිකමය වශයෙන් නිශේදනාත්මක විශ්වාසයන් ඇතැයි ඔබ විශ්වාස කරනවා ද? ඔව් නම් ඒවා මොනවා ද?**

මෙම ප්‍රශ්ණය සඳහා ආබාධ සහිත තරුණයන් 22 දෙනාගේ නියැදියෙන් 22ම පිළිතුරු ලබා දී ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත්කකල 100 % කි.

ඒ අතරින් 13 දෙනෙකු සමාජය තුල එසේ නිශේදනාත්මක විශ්වාසයන් නොමැති බව ප්‍රකාශ කරයි. එසේම ඒ පිළිබඳව අවබෝදයක් නොමැති සංඛ්‍යාව 05 දෙනෙකි.
එසේම සමාජය තුල පවත්නා නිශේදනාත්මක අදහස් පිළිබඳ ප්‍රතිචාර දක්වා තිබෙන්නේ 04

ඒ අනුව වැඩි ප්‍රතිශතයකගේ මතය වී තිබෙන්නේ ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ සමාජය තුල නිශේදනාත්මක මතයක් නොමැති බවයි.

**10. ආබාධ සහිත අඹු සැමියන් විවාහ ජීවිතයකදී මුහුණ දිය හැකි විශාලතම අභියෝග මොනවා දැයි ඔබට කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සඳහා සම්පූණර් නියැදිය වන ආබාධ සහිත තරුණයන් 22 දෙනාගෙන් 22ම ප්‍රතිචාර දක්වා තිබේ.
ඒවා පහත අයුරින් විශ්ලේෂණය කලහැක.

| **අභියෝග පැමිණියහැකි අංශ** | **ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව** |
|---|---|
| සමාජමය අභියෝග | 03 |
| ආර්ථිකමය අභියෝග | 11 |
| එදිනෙදා කටයුතු පිළිබඳ අභියෝග | 03 |
| දරුවන් පිළිබඳ අභියෝග | 05 |
| අදහසක් නොමැත | 04 |
| ලිංගික කටයුතු පිළිබඳ අභියෝග | 01 |

( ඒ අනුව ආබාධ සහිත පුද්ගලයා සිය පවුල් සංස්ථාව තුල ආර්ථික කටයුතු නිසි අයුරින් කළමණාකරණය කරගැනීමට අපොහොසත් වන බව වැඩි දෙනෙකුගේ මතය වී තිබේ. )

11. ආබාධ සහිත නොවන අඹු සැමියන් විසින් විවාහ ජීවිතයකදී මුහුණ දිය හැකි විශාලතම අභියෝග මොනවා දැයි ඔබට කිව හැකි ද?

මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ නියැදිය වන තරුණයන් 22 දෙනාගෙන් 22ම ප්‍රතිචාර දක්වා තිබේ.


ඒවා පහත අයුරින් විශ්ලේෂණය කලහැක.

| **අභියෝග පැමිණියහැකි අංශ** | **ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව** |
|---|---|
| අනවබෝධය | 02 |
| ආර්ථිකමය අභියෝග | 13 |
| එදිනෙදා කටයුතු පිළිබඳ අභියෝග | 03 |
| කිව නොහැත | 04 |

( ඒ අනුව පෙනී යන්නේ ආබාධ සහිත නොවන අඹුසැමියන් ද මුහුණ පාන ප්‍රධාන ගැටළුව ආර්ථික කටයුතු සම්බන්ධ අභියෝග බවයි. )

# ආබාධ සහිත නොවන තරුණයින් තුල ආබාධ සහිත තරුණියන් පිළිබඳ ඇති ආකල්ප


1. ඔබ ආබාධ සහිත තරුණියක් හෝ කිහිප දෙනෙකු හඳුනනවා ද?




මෙහිදි ආබාධ සහිත තරුණියක් හෝ කිහිපදෙනෙකු හඳුනනවාද යන්නට ඔව් යන පිළිතුර ලබා දී ඇති ප්‍රතිශතය 55.2 %ක් වන අතර හඳුනන්නේ නැත යන පිළිතුර ලබා දී ඇති ප්‍රතිශතය 44.8 % වේ .


මෙයින් එලබිය හැකි නිගමනය වන්නේ සමාජයතුල ජීවත් වන මනුෂ්‍ය කොටසක් ලෙස ආබාධ සහිත ප්‍රජාව පිළිබඳ අවබෝධයක් නොමැති පිරිස හරි අඩකට සමාන වීමට ඇත්තේ ඉතා සුළු අගයක් බවයි.

## 02 ආබාධ සහිත තරුණියක සමීප ව ඇසුරු කර තිබේ ද




එහත ප්‍රශ්ණ ආංක 01 නිගමනය වාඩාත් පැහැදිලිවන කරුණක් වන්නේ මෙම ප්‍රශ්ණයට පිළිතුරු ලබා දී ඇති ප්‍රතිශතය සමගය . මෙම නියැදියෙන් 61.2%ක්ම කිසිදු අයුරකින් ආබාධ සහිත තරුණියක් ඇසුරුකර නැත.

**03.** ඔබට ආබාධ සහිත තරුණියක් පිළිබඳ කෙදිනක හෝ ප්‍රේමණීය හැඟීමක් ඇතිවී තිබේ ද?




එයින් තවත් ගම්‍ය වන කරුණක් වන්නේ තාරුණ්‍යයේ විශේෂ වූ ලක්ෂනයක් වන ආදරණීය බව හැගවෙන ප්‍රේමණීය බව යන ප්‍රස්තුතය මත මෙම නියැදියේ සිටින ආබාධ සහිත නොවන තරුණයින් තුලින් 75%ටම ආබාධ සහිත තරුණියන් පිළිබඳ කිසිදු ප්‍රේමනීය හැගීමකත් ඇති වී නැත.

නමුත් මෙම සමීක්ෂණයේ ආබාධ සහිත තරුණියන්ගෙන් කල විමසීමේදි 53.6%ක් ප්‍රකාශ කර තිබෙන්නේ ඔවුන් විවාහ වීමට කැමැත්ත ඇත්තේ ආබාධ සහිත නොවන තරුණයින් සමග බවයි. මේනිසා සමාජය තුල අපේක්ෂා භංගත්වය නිරිමාණය වේ. ඒ තුලින් සමාජ පරතරයන් නිමර්ාණය වී සමාජ ගැටුම් නිමර්ාණය වේ. මෙය තුලනය කිරීම සදහා සමාජ විද්‍යාවේ ගැටුම් න්‍යාය තුල සදහන් කරන්නේ පොදු අවකාශ වධර්නය කල යුතු බවයි. ඒතුලින් මිනිසුන්ගේ අවශ්‍යතා පිළබද සංවාද බිහි වී මෙම ගැටළුකාරී තත්වයන් සමනය කරගැනීමට හැකි වේ.


**4. ආබාධ සහිත තරුණියක් ආබාධ රහිත තරුණයෙකු හා විවාහ වීමෙන් සිදු විය හැකි අවාසි මොනවා ද?**

මෙම ප්‍රශ්නය සදහා ආබාධ සහිත නොවන තරුණයින්ගේ නියැදියෙන් 96.55% ක් ප්‍රතිචාර දක්වා ඇත. එම පිළිතුරු සියල්ලම තුල 100% අන්තගර්ත වී ඇත්තේ අබාධ සහිත තරුණියක විවාහකර ගැනීමෙන් ඔවුන්ට අවාසියක් සිදුවන බවටයි. කිසිදු තරුණයෙකු එය අවාසියට කරුණක් නොවන බවට අදහස් පලකර නොමැත.

එසේ දක්වා ඇති ප්‍රතිචාර පහත පරිදි කොටස්කල හැක .

| අංශය | ප්‍රතිචාර අකවා ඇති සංඛ්‍යාව |
|---|---|
| එදිනෙදා කටයුතු | 11 |
| ප්‍රවේශ පහසුකම් | 01 |
| ආර්ථික | 06 |
| දරුවන් බිහිකිරීම | 02 |
| ආරක්ෂාව | 03 |
| සමාජීය | 06 |
| ලිංගිකත්වය | 01 |

**5.ආබාධ සහිත තරුණියක් විවාහ කර ගැනීමෙන් සිදු විය හැකි තත්වයන් පහත පරිදි වේ. ඔබගේ එකඟතාවය පල කරන්න.**




මෙහි වැඩි පිරිසක් පල කර ඇති අදහස වන්නේ ආබාධ සහිත තරුණියක් විවාහ කරගැනීමෙන් ආබාධ සහිත දරුවන් බිහි වීමට ඇති ඉඩ ප්‍රෂ්ඨාව වැඩි බවයි. එය සම්පූර්ණ නියැදියෙන් 92.3%ක් තරම් විශාල අගයකි.

එසේම ගෙදර වැඩ වලදී ඇයගේ සහය නොලැබීම හා ඇයව රැකබලාගැනීමට සිදුවීම යන කරුණු අවාසි සහගත තත්වයන් ලෙස 53.8% ක් සඳහන්කර තිබේ.

**6. ආබාධ සහිත කාන්තාවන් ශ්‍රී ලංකා සමාජය තුලට අන්තර්කරණය කිරීමට හා ඔවුන්ට වඩාත් හොඳ පිළිගැනීමක් ලබා දීමට ඔබ විසින් කරන යෝජනා කවරේ ද?**

මෙම ප්‍රශ්ණයට තරුණයින් 27 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. එම දත්ත විශ්ලේෂණය සඳහා කොටස් දෙකකට වෙන්කිරීමට හැක.

01. අන්තකර්රණ යෝජනා
02. අන්තකර්රණයට අදාල නොවන යෝජනා

| **අන්තර්කරණ යෝජනා** | **අන්තර්කරණයට අදාල නොවන යෝජනා** |
|---|---|
| ස්වයං රැකියා හදුන්වා දීම තුලින් ඔවුන් ආර්ථිකමය වශයෙන් සවිමත් කිරීම<br>2.සංවිධාන පිහිටවීම තුලින් ඔවුන් ඒ හරහා සමාජගත කිරීම | ආබාධ සහින සංවිධාන පිහිටුවා ඔවුන්ව ඒ සඳහා යොමු කිරීම |
| ඇයව සමාජය තුල කොන් නොකර හොද අධයාපනයක් ලබාදී සමානාය කාන්තාවක් ලෙස සමාජ ගත කිරීම | ඔවුන්ට කියා සමිති සමාගම් සාදා ඔවුන් ඒ සඳහා යොමු කිරීම |
| සමාජයේ ඔවුන් කොන් නොකර සම අයිතීන් ඔවුන්ටද ලබාදීම තුලින් අන්තර් කරනය කිරීම කල හැක | ආබාධ සහිත පුද්ගලයින් අන්තකර්රනය කිරීමට අපහසුයි,මොකද කුඩා අවදියේ සිටම ඔවුන්ගේ දෙමාපියන්ට ඔවුන්ට උගන්නනේ යැපුම් මානසිකත්වයයි, එම නිසාවෙන් ඔවුන්ව අනිතකර්රනය කිරීමට හැකියාවක් ශ්‍රී ලංකාව තුල නැත |
| ඔවුන්ගේ සැගවී ඇති හැකියාවන් එලියට අරගෙන ඔවුන්ට ඒ සඳහා පුලුවන් අයුරින් උදව් කල යුතුයි | අදහසක් නැත |
| ආථරීකය ශක්තිමත් කිරීම සඳහා ඔවුන්ටද රැකියා අවස්ථා හදුන්වාදීම තුලින් යැපෙන මානසිකත්වය ඉවත්කිරීමට හැකියාව පවතී | ඔවුන්ටම වෙන්වූ සහ ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීම සඳහා ඔවුන්ටම කතාබහ කරගැනීම සඳහා ඔවුන්ටම වෙන් වූ සමිති සමාගම් පිහිටීම තුලින් ඔවුන්ව සමාජගත වීම ඉබේම සිදුවේ |
| සමාජයේ ගිවිසුම් තුල තිබෙන ආකල්ප වෙනස් කිරීම | ඔවුනට වෙන්වූ සමිති සමාගම් වලින් ඔවුන්ට සමාජගත කිරීමට සිදු කිරීමට හැකිය |
| මිනිසුන් තුල ආබාධ සහිත පුද්ගලයින් පිළිබද ඇති ආකල්ප(වැඩ කිරීමට නොහැකි, යැපෙන්නන් සේ සැලකීම) නැති කිරීම තුලින් ඔවුන්ට රැකියා අවස්ථාවක් හදුන්වාදීම තුලින් | ප්‍රධාන වශයෙන් ආ:ස කාන්තාවන් හට වෙන්වූ සංගම් පිහිටුවා ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කල හැකි පිරිසක් එකතු කරගැනීම තුලින් ඔවුනට අවශ්‍ය සාමාජීය පිලිගැනීම ලගාකරගත හැකිය |
| සමාජය තුල නිබෙන (ආ:ස අයට කිසිම දෙයක් බෑ) යන ආකල්ප වෙනස්කිරීම ස්වයං රැකියා හදුන්වාදීම | සැම විටම ඔවුන්ව සමාජයේ ඉදිරියට ගැනීම සඳහා ඔවුන්ටම වෙන්වූ සමිති සමාගම් ආරම්භ කිරීම |
| ඔවුන්ට යැපෙන්නන් සේ මානසිකත්වය ඔවුන් තුලින් අයින් කිරීම සඳහා ඔවුන්ට ඒ පුහුණුවක් ලබාදීම | ඔවුන්ව විශේෂ යැයි සලකා කටයුතු කිරීම |
| සමාජය තුල පවතින ඔවුන්ව විශේෂ යැයි සලකන මතය නැති කිරීම තුලින් ඔවුන් | |

| | |
|---|---|
| යැපෙන්නන් සේ සලකන මතය දුරුකිරීම සිදුකල හැකිය | |

මෙයින් නිගමනය කලහැකි කරුණ වන්නේ ආබාධ සහිත නොවන තරුණයින් තුල ආබාධ සහිත කාන්තාවන් අන්තකර්රණය පිළිබඳ පොදු මතයක් සමාජය තුල නොමැති බවත් සැලකිය යුතු පිරිසක් සදහා අන්තකර්රණය පිළිබඳ දැනුමක් නොමැති බවත්ය.

## 07. ආබාධ සහිත කාන්තාවන් පිළිබඳ ලාංකික තරුණයින්ගේ ආකල්ප කෙබඳුදැයි ඔබට කෙටියෙන් කිව හැකි ද?

මෙම ප්‍රශ්ණය සදහා සම්පූණර් නියැදිය වන තරුණයින් 29 දෙනාගෙන් 28 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 96.55% කි.

ඒ අතරින් ආබාධ සහිත කාන්තාවන් පිළිබඳ ධනාත්මක ආකල්පයකින් පිළිතුරු ලබාදී ඇත්තේ පුද්ගලයින් 04 දෙනෙකු පමණි. එය ප්‍රතිචාර දැක් වූ පුද්ගලයින්ගෙන් 14.02%ක් තරම් සුළු ප්‍රතිශතයකි.

උදා:

- ආබාධ සහිත කාන්තාවන් අනෙක් මිනිසුන් මෙන්ම විවිධාකාර හැකියාවන්ගෙන් සමන්විත පුද්ගලයින් පිරිසකි.

- අනුකම්පාව ලබාදීමෙන් තොරව සහ අනුකම්පාව දක්වා ඔවුන්ගේ හැකියාවන් තුලින් සමාජය තුල ඉදිරියට යාමටත්,සමාජයේ අනෙක් මිනිසුන් හා සමාන පරිදි ජීවන රටාවක් ගතකල යුතුබවයි

ඉතිරි අය සියළුදෙනාගේ ආකලපයන් ගත්කල සෘණාත්මක ඒවා වේ. එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 85.7% කි.

උදා:

- අන් අයගෙන් යැපෙන සමාජය තුල කොන් වී සිටින කොටසක්.
- අනුන්ගෙන් යැපෙන අය ලෙස සලකා කටයුතු කිරීම
- බොහෝ විට යැපෙන්නන් ලෙස ජීවතය ගෙනයාමට පුරුදු වී සිටින කොටසක්.

## 08. ආදරණීය සහකාරියක් ඔබ සොයන්නේ නම් වැඩි වශයෙන් සලකා බැලීමට කැමති විශේෂිත ආබාධිත වර්ග තිබේ ද?ඒ මොනවා ද?

මේ පිළබඳ තරුණයින් 28 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇති අතර එයින් 09 දෙනෙකු ප්‍රකාශ කර ඇත්තේ ඒ පිළිබඳ විශේෂයක් නොමැති බවය.

- තිදෙනෙකු චලනාබාධ කාන්තාවන් විශේෂ කර තිබේ.
- තවත් 06 දෙනෙකු කථනාබාධ කාන්තාවන් විශේෂකර තිබේ.

- තවත් 05 දෙනෙකු ශ්‍රවණාබාධ කාන්තාවන් විශේෂකර තිබේ.

- මෙහිදි වැඩි පිරිසක් විශේෂයක් නොමැති බව ප්‍රකාශ කිරීමෙන් නිගමනය කල හැකි වන්නේ ආබාධ සහිත භාවයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් එම පිරිසට නොමැතිබවයි.

**09. ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ සාමාජීය හෝ සංස්කෘතිකමය වශයෙන් ඍණාත්මක ආකල්ප ඇතැයි ඔබ විශ්වාස කරනවා ද? ඔව් නම් ඒවා මොනවා ද?**

මෙම ප්‍රශ්ණය සදහා තරුණයින් 29 දෙනාගේ නියැදියෙන් 28 දෙනෙකුම පිළිතුරු ලබා දී ඇත. එයින් 05 දෙනෙකු ප්‍රකාශකර ඇත්තේ ඒ පිළිබඳ අදහසක් නොමැති බවයි. නමුත් 23 දෙනෙක් ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ සමාජය තුල පවතින ඍනාත්මක ආකල්ප වලට නිදසුන් ලබාදී තිබේ.
උදා:

- තමාගේ වැඩකටයුතු කරගත නොහැකි,රටට බරක් වූ මිනිසුන් පිරිසක් ලෙස
- වැඩකට එලියට යාමට සුදානම් වූ අවස්ථාවකදී උදැසනම ආ:ස පුද්ගලයෙකු ඉදිරියට පැමිනීම තුලින් ගමනම අසුභයි යන විශ්වාසයක් බහුලව පවතී
- සමාජය ඉදිරියේ අවමනායට ලක්වන කොටඨාසයකි

**10. ආබාධ සහිත අඹු සැමියන් විවාහ ජීවිතයකදී මුහුණ දිය හැකි විශාලතම අභියෝග මොනවා දැයි ඔබට කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සදහා සම්පූණර් නියැදිය වන තරුණයින් 29 දෙනාගෙන් 28 දෙනෙකු ප්‍රතිචාර දක්වා තිබේ.
ඉන් පිළිතුරු 17ක්ම ආථර්ික අපහසුතා පිළිබඳ කියැවෙන ඒවාය

එසේ දක්වා ඇති ප්‍රතිචාර පහත පරිදි විෂ්ලේෂණය කලහැක.

| අභියෝග පැමිණියහැකි අංශ | ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| සමාජමය අභියෝග | 06 |
| ආථර්ිකමය අභියෝග | 17 |
| එදිනෙදා කටයුතු පිළිබඳ අභියෝග | 03 |
| ලිංගික කටයුතු පිළිබඳ අභියෝග | 03 |

**( ඒ අනුව ආබාධ සහිත පුද්ගලයා සිය පවුල් සංස්ථාව තුල ආර්ථික කටයුතු නිසි අයුරින් කළමණාකරණය කරගැනීමට අපොහොසත් වන බව වැඩි දෙනෙකුගේ මතය වී තිබේ. )**

**11. ආබාධ සහිත නොවන අඹු සැමියන් විසින් විවාහ ජීවිතයකදී මුහුණ දිය හැකි විශාලතම අභියෝග මොනවා දැයි ඔබට කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ නියැදිය වන තරුණයින් 29 දෙනාගෙන් 28 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත.


ඉන් පිළිතුරු 17ක්ම ආථරීක අපහසුතා පිළිබඳ කියැවෙන ඒවාය

එම ප්‍රතිචාරයන් පහත පරිදි විශ්ලේෂණය කල හැක.

| අභියෝග පැමිණිය හැකි අංශ | ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| අනවබෝධය | 03 |
| ආථරීකමය අභියෝග | 17 |
| එදිනෙදා කටයුතු පිළිබඳ අභියෝග | 03 |
| දරුවන් පිළිබඳ අභියෝග | 04 |
| ලිංගික කටයුතු පිළිබඳ අභියෝග | 02 |

ඒ අනුව පෙනි යන්නේ ආබාධ සහිත නොවන අඹු සැමියන්ගේ පවුල් ජීවිත සඳහාද මුහුණ පාන්නට සිදු වන ප්‍රධානතම අභියෝගය ආථරීක අපහසුතා බවයි.


**1. ඔබ ආබාධ සහිත තරුණයෙක් හෝ කිහිප දෙනෙකු හඳුනනවා ද?**




මෙහිදී ආබාධ සහිත තරුණයෙක් හෝ කිහිපදෙනෙකු හඳුනනවාද යන්නට ඔව් යන පිළිතුර ලබා දී ඇති ප්‍රතිශතය 68.2 %ක් වන අතර හඳුනන්නේ නැත යන පිළිතුර ලබා දී ඇති ප්‍රතිශතය 31.1 % වේ .

**( මෙය ආබාධ සහිත කාන්තාවන් පිළඳබඳ ආබාධ සහිත නොවන තරුණයින් ලබා දී ඇති පිළිතුරුවල ප්‍රතිශතයට වඩා 13%ක වැඩි වීමකි. ඒ අනුව ආබාධ සහිත නොවන තරුණයින්ට වඩා තරුණියන් ආබාධ සහිත තරුණයින් හඳුනන බව නිගමනය කල හැක)**


**02 . ආබාධ සහිත තරුණයෙකු සමීප ව ඇසුරු කර තිබේ ද?**



එම නිගමනය වාඩාත් පැහැදිලිවන කරුණක් වන්නේ මෙම ප්‍රශ්ණයට පිළිතුරු ලබා දී ඇති ප්‍රතිශතය සමගය . මෙම නියැදියෙන් 81.8 %ක්ම කිසිදු අයුරකින් ආබාධ සහිත තරුණයෙක් ඇසුරුකර නැත.

(මෙම ප්‍රතිශතය ආබාධ සහිත නොවන තරුණයින් ලබාදී ඇති නැත යන ප්‍රතිචාරයේ ප්‍රතිශතයට වඩා 20.6 % ක වැඩි වීමකි.)

**03.ඔබට ආබාධ සහිත තරුණයෙකු පිළිබඳ කෙදිනක හෝ ප්‍රේමණීය හැඟීමක් ඇතිවී තිබේ ද?**




මෙම ප්‍රශ්නය ඉතා වැදගත් නිගමනයකට එලබිය හැකි එකකි. එමෙන්ම මෙම නියැදියේ සිටින ආබාධ සහිත නොවන තරුණියන් කිසිදු අයෙකුට ආබාධ සහිත තරුණයින් පිළිබඳ කිසිදු දිනක ප්‍රේමනීය හැඟීමක් ඇති වී නොමැත. එම ප්‍රශ්ණයට නැත යන පිළිතුර ලබා දී ඇති ප්‍රතිශතය 100 %කි.

නමුත් මෙහි ප්‍රධාන ගැටළුව වන්නේ මෙම සමීක්ෂණයේ එක් නියැදියක් වන ආබාධ සහිත තරුණයින්ගෙන් ඔබට ආබාධ සහිත නොවන තරුණියන් පිළිබඳ කෙදිනක හෝ ප්‍රේමණීය හැඟීමක් ඇති වී තිබේද යන්න විමසූ විට සියළුදෙනා ප්‍රකාශ කර ඇත්තේ ඔව් යන පිළිතුරයි. එය ප්‍රතිශතයක් ලෙස 100 % කි .


**04.ආබාධ සහිත නොවන තරුණියක් ආබාධ සහිත තරුණයෙකු හා විවාහ වීමෙන් සිදු විය හැකි අවාසි මොනවා ද?**

මෙම ප්‍රශ්නය සඳහා ආබාධ සහිත නොවන තරුණියන්ගේ නියැදියෙන් 90.90% ක් ප්‍රතිචාර දක්වා ඇත. එම පිළිතුරු සියල්ලම තුල 100% අන්තගර්ත වී ඇත්තේ අබාධ සහිත තරුණයෙකු විවාහකර ගැනීමෙන් ඔවුන්ට අවාසියක් සිදුවන බවටයි. කිසිදු තරුණියෙකු එය අවාසියට කරුණක් නොවන බවට අදහස් පලකර නොමැත.

එසේ දක්වා ඇති අවාසි සහගත තත්වයන් මෙසේ විශ්ලේෂණය කල හැක.

| අංශය | ප්‍රතිචාර අකවා ඇති සංඛ්‍යාව |
|---|---|
| එදිනෙදා කටයුතු | 04 |
| ප්‍රවේශ පහසුකම් | 02 |
| ආර්ථික | 04 |
| දරුවන් බිහිකිරීම | 01 |
| ආරක්ෂාව | 01 |
| සමාජීය | 02 |
| ලිංගිකත්වය | 01 |

**05.ආබාධ සහිත තරුණයෙකු විවාහ කර ගැනීමෙන් සිදු විය හැකි තත්වයන් පහත පරිදි වේ. ඔබගේ එකඟතාවය පල කරන්න.**




මෙහි වැඩිපිරිසක් පල කර ඇති අදහස වන්නේ ආබාධ සහිත තරුණයෙක් විවාහ කරගැනීමෙන් ආබාධ සහිත දරුවන් බිහි වීමට ඇති ඉඩ ප්‍රස්ථාව වැඩි බවයි. එය සම්පූර්ණ නියැදියෙන් 90.9 %ක් තරම් විශාල අගයකි.

- එසේම ගෙදර වැඩවලදී ඇයගේ සහය නොලැබීම හා ඇයව රැකබලාගැනීමට සිදුවීම යන කරුණ අවාසි සහගත තත්වයන් ලෙස 63.6% ක් සඳහන්කර තිබේ.
- තවද ලිංගික ජීවිතය අතෘප්තිකර එකක් වන බව 50 % ක් ප්‍රකාශකර ඇත.

**6. ආබාධ සහිත තරුණයන් ශ්‍රී ලංකා සමාජය තුලට අන්තර්කරණය කිරීමට හා ඔවුන්ට වඩාත් හොඳ පිළිගැනීමක් ලබා දීමට ඔබ විසින් කරන යෝජනා කවරේ ද?**

| අනතර්කරණ යෝජනා | අන්තර්කරණයට අදාල නොවන යෝජනා |
|---|---|
| ඒ අයට යම් යම් කායර්යන් කිරීමට අවස්ථාවක් ලබාදීම | සමාජ සේවා ආයතන පිහිටුවීම |
| ඔවුන්ගේ හැකියාවන් හඳුනාගෙන ඒවා ඔප් නැංවීමට අවස්ථාව ලබාදීම | |
| ඔවුන්ට ආදායම් ලබාගත හැකි රැකියා හෝ ව්‍යාපාර පිලිබඳ පුහුණුව ලබාදීම | |
| පෞරුෂ වධර්නයට සුදුසු ක්‍රියාමාගර් ගැනීම | |
| ඔවුන් පිලිබඳ යහපත් ආකල්ප සමාජය තුල ගොඩනැගීම | |
| බාහිර සමාජය තුල ආ.ස.භාවය පිලිබඳ හා ඔවුන්ගේ හැකියාවන් පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | |
| ප්‍රධාන රාජ්‍ය ආයතන වල සේවය සැපයීම සදහා සංඥා භාෂාව පිලිබඳ දැනුවත් නිලධාරීන් පත් කිරීම | |
| පුළුල් රැකියා අවස්ථා ඇති කිරීම | |
| සන්නිවේදනය සදහා සංඥා භාෂා ප්‍රවධර්නය කිරීම | |
| පුද්ගලික හා රාජ්‍ය ආයතනයන්හි ප්‍රවේශය පුළුල් කිරීම | |
| නිසි අධ්‍යාපනය ලබාදීම | |
| නායකත්ව පුහුණු පැවැත්වීම | |
| ඔවුන්ගේ ජීවිතයට අවශ්‍ය උපදේශනය ලබාදීම | |
| ආකල්ප සංවධර්නය | |
| ආ.ර.අය.හා එකට කටයුතු කිරීමට අවස්ථාව ලබාදීම | |
| ඔවුන්ටම වෙන්වූ පාසල් නැතිව ඔවුන්ට ආබාධ රහිත අය සමග ඉගෙන ගැනීමට සැලැස්වීම | |
| ඔවුනට විශේෂිත පුද්ගලයන් ලෙස සලකා සමාජයෙන් කොන් නොකිරීම | |

ඉහත විශ්ලේෂණයට අනුව පෙනී යන්නේ ආබාධ සහිත තරුණයින් අන්තකර්රණය පිළිබඳ ආබාධ සහිත නොවන කාන්තාවන් තුල ඉතා හොඳ මට්ටමේ අදහස් පවතින බවත් ඔවුන් විසින් යෝජනාකර ඇති එක් යෝජනාවක් හැරෙන්නට අනෙක් සියලු යෝජනා අන්තකර්රණය හා සම්බන්ධ වන බවත්ය .

**7. ආබාධ සහිත තරුණයන් පිළිබඳ ලාංකික තරුණියන්ගේ ආකල්ප කෙබඳුදැයි ඔබට කෙටියෙන් කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ නියැදිය වන තරුණියන් 22 දෙනාගෙන් 17 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 77.27 % කි.

ඒ අතරින් ආබාධ සහිතතරුණයින් පිළිබඳ ධනාත්මක ආකල්පයකින් පිළිතුරු ලබාදී ඇත්තේ පුද්ගලයින් 05 දෙනෙකු පමණි. එය ප්‍රතිචාර දැක් වූ පුද්ගලයින්ගෙන් 29.41 %ක ප්‍රතිශතයකි.

උදා:

- ආ.ස.වුවද අනෙකුත් විවිධාකාර හැකියාවන් කුසලතාවයන්ට සම තැන ලබා දීම
- ආ.ස.වුවද ජීවිතය පිලිබඳ සාථර්කව ඉදිරියට ගෙන යා හැකි නම් සමාජය පිලිබඳ දැනුමක් ඇත්නම් අන් අය සමග සුහදව සිටිය හැකි නම් ජීවිතය සාථර්ක කර ගත හැක.

ඉතිරි අය සියළුදෙනාගේ ආකල්පයන් ගත්කල සෘණාත්මක ඒවා වේ. එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 70.59 % කි.

උදා:

- ඔවුන් පිලිබඳ අනුකම්පාවක් ඇති වීම
- ඔවුන්ට පුළුල් සමාජානුයෝජනයක් නැත
- ඔවුන් පිළිබඳව බොහෝ දුරට ඇත්තේ අනුකම්පාවකි.

**8. ආදරණීය සහකරුවෙකු ඔබ සොයන්නේ නම් වැඩි වශයෙන් සලකා බැලීමට කැමති විශේෂිත ආබාධිත වර්ග කිබේ ද?ඒ මොනවා ද?**

මේ පිළබඳ තරුණියන් 12 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. එය සම්පූර්ණ නියැදියෙන් 54.54 %ක ප්‍රතිශතයකි. ඒ අනුව මෙම ප්‍රශ්නයට 45.46 % ක් ප්‍රතිචාර දක්වා නොමැත.

එසේ දක්වන ලද ප්‍රතිචාර මෙසේ දැක්විය හැක.

| ආබාධ සහිත භාවය | ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| ශාරීරික ආබාධ | 01 |
| ශ්‍රවනාබාධ | 02 |
| කථනාබාධ | 02 |
| ශ්‍රව්‍යාබාධ | 02 |
| දෘෂ්‍යාබාධ | 03 |

මෙහිදි වැඩි පිරිසක් ප්‍රතිචාර නොදැක්වීමෙන් නිගමනය කල හැකි වන්නේ ආබාධ සහිත භාවයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් එම පිරිසට නොමැතිබව හෝ කිසි සේත් ආබාධ සහිත තරුණයෙකු සහකරු ලෙස තෝරාගැනීමට අදහස් නොකිරීමත් යන කරුණයි.

**9. ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ සාමාජීය හෝ සංස්කෘතිකමය වශයෙන් සෘණාත්මක ආකල්ප ඇතැයි ඔබ විශ්වාස කරනවා ද? ඔව් නම් ඒවා මොනවා ද?.**

මෙම ප්‍රශ්නය සදහා තරුණියන් 22 දෙනාගේ නියැදියෙන් 14 දෙනෙකු පිළිතුරු ලබා දී ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත්කල 63.63 % කි.
ඔවුන්ට ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ සමාජයේ ඇති සෘණාත්මක ආකල්ප පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් ඇති බව ලබා දී ඇති ප්‍රතිචාරයන් තුලින් පෙනියයි.

උදා:

- ඔවුන් නිතර දැකීම සුභ නොවන බව විශේෂයෙන් කාන්තාවන් මව් පදවිය ලැබීමට සූදානම් වන අවධියේදී
- ආ.ස.ප්‍රජාව සෑම විටම අනුන් මත යැපීමටම උත්සාහ කරන කොටසක් වීම
- ඔවුන් දුවර්ල පෞරුෂයක් ඇති අය බව
- යහපත් පවුල් ජීවිතයක් ගත කල නොහැකි බව

**10. ආබාධ සහිත අඹු සැමියන් විවාහ ජීවිතයකදී මුහුණ දිය හැකි විශාලතම අභියෝග මොනවා දැයි ඔබට කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සදහා සම්පූර්ණ නියැදිය වන තරුණියන් 22 දෙනාගෙන් 19 දෙනෙකු ප්‍රතිචාර දක්වා තිබේ.
ඒවා පහත අයුරින් විශ්ලේෂණය කලහැක.

| අභියෝග පැමිණියහැකි අංශ | ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| සමාජමය අභියෝග | 02 |
| ආර්ථිකමය අභියෝග | 15 |
| එදිනෙදා කටයුතු පිළිබඳ අභියෝග | 08 |
| දරුවන් පිළිබඳ අභියෝග | 09 |
| ප්‍රවේශ පහසුකම් පිළිබඳ අභියෝග | 04 |
| ලිංගික කටයුතු පිළිබඳ අභියෝග | 03 |

**( ඒ අනුව ආබාධ සහිත පුද්ගලයා සිය පවුල් සංස්ථාව තුල ආර්ථික කටයුතු නිසි අයුරින් කළමණාකරණය කරගැනීමට අපොහොසත් වන බව වැඩි දේනෙකුගේ මතය වී තිබේ. )**

**11. ආබාධ සහිත නොවන අඹු සැමියන් විසින් විවාහ ජීවිතයකදී මුහුණ දිය හැකි විශාලතම අභියෝග මොනවා දැයි ඔබට කිව හැකි ද?**

මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ නියැදිය වන තරුණියන් 22 දෙනාගෙන් 20 දෙනෙකු ප්‍රතිචාර දක්වා තිබේ.

ඒවා පහත අයුරින් විශ්ලේෂණය කලහැක.


| අභියෝග පැමිණියහැකි අංශ | ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව |
|---|---|
| අනවබෝධය | 07 |
| ආර්ථිකමය අභියෝග | 13 |
| එදිනෙදා කටයුතු පිළිබඳ අභියෝග | 02 |
| දරුවන් පිළිබඳ අභියෝග | 08 |
| මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අභියෝග | 04 |
| ලිංගික කටයුතු පිළිබඳ අභියෝග | 04 |

**( ඒ අනුව පෙනී යන්නේ ආබාධ සහිත නොවන අඹුසැමියන් ද මුහුණ පාන ප්‍රධාන ගැටළුව ආර්ථික කටයුතු සම්බන්ධ අභියෝග බවයි. )**

# <u>පොදු ප්‍රශ්නාවලිය - විවාහය හා ලිංගික ජීවිතය</u>


1. ඔබ සිතන පරිදි ලිංගිකව පළමුව එක්වීමට සුදුසු ම වයස වන්නේ කුමක්ද? .....

99 responses




2. පළමු වරට ලිංගිකව එක්වීමේ දී ගැබ් ගැනීමක් සිදු විය හැකි ද?

99 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත


| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 19 | 02 | 07 |
| අබාධ සහිත පිරිමි | 15 | 06 | 01 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 18 | 02 | 02 |
| ආබාධ සහිත නොවන පිරිමි | 21 | 07 | 01 |

- ලිංගිකත්වය පිළිබඳ ඉහත විමසා ඇති ප්‍රශ්නයට ලබා දී ඇති ප්‍රතිචාර දෙසබැලූ විට ඒ පිළිබඳ එක හා සමාන වූ දැනුමක් නියැදියේ සිටින කාණ්ඩ 04 ටම සමාන අයුරි ඇති බව පෙනේ.

- එසේම එම ගැටළුව පිළබඳව නොදනී යනුවෙන් වැඩි ප්‍රතිචාර ප්‍රමාණයක් ලැබී තිබෙන්නේ ආබාධ සහිත කාන්තාවන්ගෙනි. ඒ අනුව එම ගැටළුව පිළිබඳ ඇති දැනුමේ යම් අඩුවක් ඔවුන් තුල දැකිය හැක .

3. ලිංගාශ්‍රිත රෝග සිප වැලඳ ගැනීමෙන් වැළඳිය හැකි ද?

99 responses





නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 09 | 14 | 05 |
| අබාධ සහිත පිරිමි | 19 | 03 | 0 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 06 | 13 | 03 |
| ආබාධ සහිත නොවන පිරිමි | 23 | 04 | 2 |

- මෙම ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුරු අනුව පිරිමින් සහ කාන්තාවන් අතර ඇති දැනුමේ යම් වෙනසක් දක්නට ලැබේ. පිරිමින් බහුතරයක් ඔව් යන පිළිතුර ලබාදෙන විට කාන්තාවන් බහුතරයක් නැත යන පිළිතුර ලබා දේ.
- එසේම එම ප්‍රශ්නය සදහා නොදනී යනුවෙන් පිළිතුරු ලබා දී ඇති 10 දෙනාගෙන් 08 දෙනෙකුම කාන්තාවන්ය .

4. මුඛ සංසගර්යේදී ලිංගික රෝග වැළඳිය හැකි ද?

98 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත


| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 08 | 12 | 08 |
| අබාධ සහිත පිරිමි | 14 | 06 | 02 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 10 | 06 | 06 |
| ආබාධ සහිත නොවන පිරිමි | 22 | 04 | 03 |

- මෙම ගැටළුව සඳහා ඔව් යන පිළිතුර ලබා දී ඇති පිරිසෙන් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ තරුණයින්ය. එය ඔව් පිළිතුර ලබා දුන් ප්‍රතිචාරකයින් ගණන වන පුද්ගලයින් 54 දෙනාගෙන් 36 වැනි ඉහල අගයකි.

- නොදනී යනුවෙන් පිළිතුරු ලබා දී ඇති පිරිසෙන් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ තරුණියන්ය . එය නොදනී පිළිතුර ලබාදුන් ප්‍රතිචාරකයින් ගණන වන පුද්ගලයින් 19 දෙනාගෙන් 14 ක් වැනි ඉහල අගයකි.

5. ඔසප් කාල සීමාව තුලදී ගැබ් ගැනීමක් සිදු විය හැකි ද?

99 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත


| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 02 | 22 | 04 |
| අබාධ සහිත පිරිමි | 07 | 14 | 01 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 05 | 16 | 01 |
| ආබාධ සහිත නොවන පිරිමි | 07 | 22 | 0 |

- මෙම ප්‍රශ්ණය සදහා ලබා දී ඇති පිළිතුරු අනුව නිගමනය කල හැකි කරුණ වන්නේ ඒ පිළිබද දැනුම හා අවබෝධය කාණ්ඩ 04 තුලම යම් සැලකිය යුතු ප්‍රමාණයකට සමානව ඇති බවයි.

- තවද නොදනී යනුවෙන් පිළිතුරු ලබා දී ඇති පිරිසෙන් 66.66 % ක්ම ආබාධ සහිත කාන්තාවන්ය.

6. පිරිමි සහකරු යෝනි මාගර්ය තුල ශුක්‍ර මෝචනයක් සිදු නොකල අවස්ථාවක ගැබ් ගැනීමක් සිදු විය හැකි හැකිද?

99 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 06 | 17 | 05 |
| අබාධ සහිත පිරිමි | 12 | 10 | 0 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 06 | 11 | 05 |
| ආබාධ සහිත නොවන පිරිමි | 08 | 17 | 04 |

- මෙම ප්‍රශ්ණය සදහා කාණ්ඩායම් 03ක බහුතරයේ පිළිතුර වී ඇත්තේ නැත යන්නයි.
- ආබාධ සහිත පිරිමි කාණ්ඩයේ පමණක් ඔව් යන පිළිතුර බහුතරයක් විසින් ලබා දී ඇත.

7. සංසගර්යෙන් තොරව (සූරතාන්තයට) ලිංගිකව උපරිම තෘප්තියකට පත්විය හැකි ද?

97 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 09 | 11 | 08 |
| අබාධ සහිත පිරිමි | 16 | 05 | 01 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 12 | 08 | 02 |
| ආබාධ සහිත නොවන පිරිමි | 22 | 02 | 05 |

- මෙම ගැටළුව සදහා කාණ්ඩ 03ක්ම වැඩි වශයෙන් ලබා දී ඇත්තේ ඔව් යන පිළිතුරය.
- ආබාධ සහිත කාන්තාවන්ගේ නියැදියේ පමණක් වැඩි පිරිසක් නැත යන පිළිතුර ලබා දී ඇත.

8. ස්වයං චින්දනය ඔබේ සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරයි ද?

98 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැත

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 04 | 20 | 04 |
| අබාධ සහිත පිරිමි | 08 | 12 | 02 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 05 | 14 | 03 |
| ආබාධ සහිත නොවන පිරිමි | 04 | 25 | 0 |

- මෙම ප්‍රශ්ණය සඳහා ලබා දී ප්‍රතිචාර අනුව නිගමනය කල හැකි කරුණ වන්නේ එම ප්‍රශ්ණය පිළිබඳ ඇති දැනුම හා අවබෝධය මෙම කණ්ඩායම් 04 තුලම යම් ආකාරයකට සමානව තිබෙන බවයි. මන්ද කණ්ඩායම් 04ම බහුතර පිළිතුර වී ඇත්තේ නැත යන්නයි.

9. සූරතාන්තයට පත්වීම සඳහා ලිංගයේ ප්‍රමාණය වැදගත් වේ ද?

99 responses




| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 13 | 08 | 07 |
| අබාධ සහිත පිරිමි | 14 | 08 | 0 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 04 | 13 | 05 |
| ආබාධ සහිත නොවන පිරිමි | 07 | 20 | 02 |

- මෙම ප්‍රශ්ණය සඳහා ලබා දී ඇති පිළිතුර මෙම නියැදිය නියෝජනය කරන ප්‍රධාන අංශ දෙක වන ආබාධ සහිත සහ ආබාධ සහිත නොවන යන කාණ්ඩ දෙක අතර දැනුමේ වෙනසක් පෙන්නුම් කරයි.
- එනම් ආබාධ සහිත තරුණ තරුණියන් වැඩි ප්‍රතිශතයක් ඔව් යන පිළිතුර ලබාදෙන අතර ආබාධ සහිත නොවන තරුණ තරුණියන් වැඩි පිරිසක් නැත යන පිළිතුර ලබා දේ.

- ඒ අනුව මෙම ප්‍රශ්ණය පිළිබඳ මෙම තරුණ කණ්ඩායම 02 අතර බහුතරමත දෙකක් පවතින බව නිගමනය කල හැක.

10. පොදු වැසිකිළියක් භාවිතා කිරීමෙන් ඔබට ලිංගාශ්‍රිත රෝග බෝ විය හැකි ද?

99 responses





නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැක.

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 15 | 10 | 03 |
| අබාධ සහිත පිරිමි | 12 | 10 | 0 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 10 | 11 | 09 |
| ආබාධ සහිත නොවන පිරිමි | 18 | 10 | 01 |

- මෙම ප්‍රශ්ණය වෙත ලබා දී ඇති පිළිතුරු විශ්ලේෂණය කිරීමේදි පෙනීයන්නේ ආබාධ සහිත නොවන තරුණියන් හැරෙන්නට අනෙක් සියළුම කාණ්ඩ ඔව් යන පිළිතුර වැඩි වශයෙන් ලබා දී තිබේ.
- එසේම ආබාධ සහිත නොවන කාන්තාවන් 09 දෙනෙකු මෙම ප්‍රශ්ණයට නොදනී යන පිළිතුර ලබා දී තිබේ.
- එයින් නිගමනය කල හැකි කරුණ වන්නේ මෙම ප්‍රශ්ණය සම්බන්ධයෙන් ආබාධ සහිත නොවන කාන්තාවන්ට ඇති දැනුම අවබෝධය අනෙක් කාණ්ඩවල අයගේ දැනුම අවබෝධයට වඩා වෙනස් බවයි.

11. පිහිනුම් හෝ නාන තටාකයකින් ඔබට ලිංගාශ්‍රිත රෝග බෝ විය හැකි ද?

98 responses




නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැක.


| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 10 | 15 | 13 |
| අබාධ සහිත පිරිමි | 11 | 09 | 02 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 09 | 12 | 01 |
| ආබාධ සහිත නොවන පිරිමි | 13 | 15 | 01 |

- මෙම ප්‍රශ්නයට ලබා දී ඇති පිළිතුරු දෙස අවධානය යොමු කිරීමේදි නියැදියේ කාණ්ඩ 04 සඳහාම නිශ්චිත දැනුමක් අවබෝධයක් නොමැති බව නිගමනය කල හැක. ඔව් යනුවෙන් ප්‍රතිචාර 43 , නැත යනුවෙන් ප්‍රතිචාර 51 ලැබී ඇත.

- ආබාධ සහිත තාන්තාවන් 13 දෙනෙකු සම්බන්ධයෙන් නොදනී යන පිළිතුර ලබා දී ඇත. එය නොදනී පිළිතුර ලබාදුන් අයගෙන 76.47 % ක් තරම් වූ ප්‍රතිශතයකි.

12. උපත් පාලන ක්‍රම සෑම විටම ගැබ් ගැනීම් වලක්වාලනු ලබයි ද?

98 responses





නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැක.

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 14 | 10 | 04 |
| අබාධ සහිත පිරිමි | 14 | 08 | 0 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 07 | 13 | 02 |
| ආබාධ සහිත නොවන පිරිමි | 06 | 22 | 01 |

- මේ සඳහා ලාබා දී ඇති ප්‍රතිචාර අනුව ආබාධ සහිත තරුණ තරුණියන් හා ආබාධ සහිත නොවන තරුණ තරුණියන් මත දෙකක සිටින බව තහවුරු වේ. ඒ අනුව ආබාධ සහිත තරුණ තරුණියන් ඔව් යන ප්‍රතිචාරයත් ආබාධ සහිත නොවන තරුණ තරුණියන් නැත යන ප්‍රතිචාරයත් ලබා දී තිබේ.

13. පිරිමි සහකරුගේ ශුක්‍රාණු ප්‍රමාණය අඩු නම් එය ගැබ් ගැනීමට බාධාවක් ද?

99 responses



නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැක.


| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 18 | 05 | 05 |
| අබාධ සහිත පිරිමි | 09 | 13 | 0 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 14 | 05 | 03 |
| ආබාධ සහිත නොවන පිරිමි | 13 | 15 | 01 |

- මෙම ප්‍රශ්ණය සදහා ලබා දි ඇති ප්‍රතිචාර අනුව පිරිමි සහ කාන්තා ප්‍රතිචාර අතර වෙනසක් ඇති බව නිගමනය කල හැක. පිරිමි කාණ්ඩ දෙක වැඩි ප්‍රතිශතයක් නැත යන පිළිතුර ප්‍රකාශ කරන අතර කාන්තා කාණ්ඩ දෙක වැඩි ප්‍රතිශතයක් ඔව් යන පිළිතුර ලබා දී ඇත.

- එම ප්‍රශ්ණයටද නොදනී යන පිළිතුර ලබා දී ඇති අයගෙන් වැඩිම ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ ආබාධ සහිත කාන්තාවන්ය

14. උපත් පාලන ක්‍රම භාවිතයෙන් ශරීර බර වැඩිවිය හැකි ද

99 responses




| | ඔව් | නැත | නොදනී |
|---|---|---|---|
| ආබාධ සහිත කාන්තාවන් | 21 | 02 | 05 |


| | | | |
|---|---|---|---|
| අබාධ සහිත පිරිමි | 12 | 09 | 01 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 16 | 04 | 02 |
| ආබාධ සහිත නොවන පිරිමි | 20 | 07 | 02 |

- මෙම ප්‍රශ්ණය සඳහා ලබා දී ඇති පිළිතුරු අනුව කාණ්ඩ 04ම දැනුම පිළිබඳ එලබිය හැකි නිගමනය වන්නේ ඔවුන් බහුතරයක් පොදු මතයක සිටික බවයි. කාණ්ඩ 04 ම වැඩි පිරිසක් ප්‍රකාශ කර ඇත්තේ ඔව් යන පිළිතුරයි.

- එම ප්‍රශ්ණයටද නොදනි යන පිළිතුර ලබා දී ඇති අයගෙන් වැඩිම ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ ආබාධ සහිත කාන්තාවන්ය.

15. නිතර ලිංගිකව එක්වීම ඔබේ සෞඛ්‍යයට අහිතකරව බලපායිද?

99 responses





නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැක.

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 09 | 13 | 06 |
| අබාධ සහිත පිරිමි | 12 | 11 | 02 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 06 | 14 | 02 |
| ආබාධ සහිත නොවන පිරිමි | 14 | 12 | 03 |

- මෙම ප්‍රශ්ණයට ඔව් යන පිළිතුර ලබා දී ඇති ප්‍රතිචාරකයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ පිරිමි පුද්ගලයින්ය. නැත යන පිළිතුර ලබා දී ඇති අයගෙන වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ කාන්තාවන්ය.
- එම ප්‍රශ්ණයටද නොදනි යන පිළිතුර ලබා දී ඇති අයගෙන වැඩිම ප්‍රතිශතයක් නියෝජනයකරන්නේ ආබාධ සහිත කාන්තාවන්ය

16. ආබාධ සහිත කාන්තාවක් සමඟ ප්‍රීතිමත් ලිංගික ජීවිතයක් ගත කල හැකිද?

99 responses





නියැදියේ ප්‍රතිචාර පහත පරිදි විශ්ලේෂණය කල හැක.

| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී |
| ආබාධ සහිත කාන්තාවන් | 20 | 03 | 05 |
| අබාධ සහිත පිරිමි | 15 | 06 | 01 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 11 | 03 | 08 |
| ආබාධ සහිත නොවන පිරිමි | 23 | 03 | 03 |

- මෙම ප්‍රශ්නයට කාණ්ඩ 04 තුලම ඇත්තේ පොදු මතයකි. කාණ්ඩ 04ම වැඩි පිරිසක් ප්‍රකාශකර ඇත්තේ ඔව් යන පිළිතුරයි.
- මෙම ප්‍රශ්නය සඳහා නොදනී යන පිළිතුර ලබා දී ඇති අයගෙන් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ ආබාධ සහිත නොවන කාන්තාවන්ය.

17. "ආබාධ සහිත කාන්තාවක් හා ආබාධ සහිත පිරිමියෙකු විවාහ වීමෙන් ආබාධ සහිත දරුවන් බිහිවිය හැකිය"

99 responses



| ජන කොට්ඨාශය | ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණය | |
|---|---|---|
| | සත්‍යයි | අසත්‍යයි |
| ආබාධ සහිත කාන්තාවන් | 20 | 08 |
| අබාධ සහිත පිරිමි | 03 | 19 |
| ආබාධ සහිත නොවන කාන්තාවන් | 12 | 10 |
| ආබාධ සහිත නොවන පිරිමි | 04 | 25 |

- මෙම මතය පිළිබඳව මෙම කාණ්ඩ 04 තුලම ඇත්තේ වෙනස් මතයක් බව පැහැදිලි වේ. එහිදි පිරිමි කාණ්ඩ 02 වැඩි වශයෙන් අසත්‍යයි යන පිළතුර ලබා දී ඇත. ( ආබාධ සහිත පිරිමින්ගෙ සම්පූණර් නියැදියෙන් 86.36 % සහ ආබාධ සහිත නොවන පිරිමින්ගේ සම්පූණර් නියැදියෙන් 86.20 % ක්)

- එය සත්‍යක් බව ප්‍රකාශ කරනු ලබන අය අතුරින් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ ආබාධ සහිත කාන්තාවන්ය . එය ඔවුන්ගේ සම්පූණර් නියැදියෙන් 71.42 % කි.

**<u>තරුණ ආබාධ සහිත තරුණ ප්‍රජාව පිළිබඳ මෙම සමීක්ෂණයට අනුව එළඹිය හැකි නිගමන .</u>**

01.ආබාධ සහිත තරුණ ප්‍රජාව තරුණාවයේ අඩංගු සියළු ලක්ෂණ ඒ ආකාරයෙන්ම තම ජීවිතයට ලගාකර ගැනීමට අපේකෂා කරන බව. ඒ අනුව ඔවුන් තාරුණ්‍ය , විවාහය හා ලිංගිකත්වය යන කරුණු පිළිබඳ ආබාධ සහිත නොවන තරුණ ප්‍රජාව මෙන්ම උනන්දු වන බව පැහැදිලි වේ. . ( ආබාධ සහිත කාන්තාවන්ගෙ ප්‍රශ්නාවලියේ 01 වන ප්‍රශ්නය යටතේ 89.7 % ක් විවාහය අපේක්ෂා කිරීම.)

02.අබාධ සහිත තරුණ ප්‍රජාව අන්තකර්රණය දැඩිව අපේක්ෂා කරන බවත් ඒ පිළිබඳ ඔවුන්ට හොඳ දැනුමක් ඇති බව. . ( ආබාධ සහිත තරුණයින්ගේ ප්‍රශ්නාවලියේ 06 වන ප්‍රශ්නය )

03. එසේ ඔවුන් අන්තකර්රණයට කැමති නමුත් සමාජයේ පවතින නොයෙකුත් බාධා මගින් ඒම අන්තකර්රණ අවස්ථා හකුලාදමා ඇති බව. ( ආබාධ සහිත කාන්තාවන්ගෙ ප්‍රශ්නාවලියේ 06 සහ07 වන ප්‍රශ්ණය ඇසුරින්)

03.සමාජයේ මුල්බැසගෙන ඇති සාම්ප්‍රදායික මතවාද ආබාධ සහිත තරුණ ප්‍රජාවගේ ජීවිත වලට දැඩිව බලපෑම් එල්ලකර ඇති බව. ( ආබාධ සහිත කාන්තාවන්ගෙ ප්‍රශ්නාවලියේ 01 වන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් 35.7 % ක් විවාහය ප්‍රතික්ෂේප කර තිබීම හා 05 වන ප්‍රශ්ණය ඇසුරින් )

04. ආබාධ සහිත ප්‍රජාවගේ විවාහය යන කාරණාවේදි ප්‍රවේශ පහසුකම් වැදගත් සාධකයක් බව. ( ආබාධ සහිත කාන්තාවන්ගෙ ප්‍රශ්නාවලියේ 08 වන ප්‍රශ්ණය ඇසුරින්)

05.විවාහ ජීවිතයේදි බලපාන පොදු ගැටළුකාරි තත්වයන් එලෙසින්ම ආබාධ සහිත ප්‍රජාවටද බලපාන අතර එම තත්වයන් විවාහ සංස්ථාවට පොදු වූ ගැටළුකාරි තත්වයන් බව.. ( ආබාධ සහිත කාන්තාවන්ගෙ ප්‍රශ්නාවලියේ 08 වන ප්‍රශ්ණය ඇසුරින් හා ආබාධ සහිත තරුණයින්ගෙන් අසනු ලැබූ 10 සහ 11 ප්‍රශ්ණ ඇසුරින් )

06. ආබාධ සහිත ප්‍රජාවගේ විවාහයට සාම්ප්‍රදායික මතවාද බලපෑම් එල්ල කරන බව. ( ආබාධ සහිත කාන්තාවන්ගෙ ප්‍රශ්නාවලියේ 10 සහ 11 වන ප්‍රශ්ණය ඇසුරින් හා ආබාධ සහිත තරුණයින්ගේන් අසනු ලැබූ 04 , 05,10 සහ 11 ප්‍රශ්ණ ඇසුරින් )

07. ආබාධ සහිත පුද්ගලයින් අන්තකර්රණය සදහා පැණනැගී ඇති ගැටළු වලට ආබාධ සහිත ප්‍රජාවගේ ඇති සෘණාත්මක ආකල්ප බලපාන බව. ( ආබාධ සහිත කාන්තාවන් වෙනුවෙන් වූ ප්‍රශ්ණ මාලාවේ 03 ප්‍රශ්ණයට ලබා දී ඇති පිළිතුරු වලට අනුව . ආබාධ සහිත තරුණයින්ගේ ප්‍රශ්නාවලියේ 04 වන ප්‍රශ්නයට අනුව )

08. අන්තකර්රණය තුලින් ආබාද සහිත ප්‍රජාවගේ ආරක්ෂාව , රැකවරණය හා ඵලදායී ජීවන රටාවක් ස්ථාපිත කිරීමට හැකි බවත. ( ආබාධ සහිත තරුණයන්ගේ ප්‍රශ්නාවලියේ 04 වන ප්‍රශ්ණය ,)

09 ආබාධ සහිත කාන්තාවන්ගෙන් හා පිරිමින්ගෙන් වැඩි ප්‍රතිශතයක් ආබාධ සහිත නොවන කාන්තාවන් හා පිරිමින් ඇසුරු කිරීමටත් ඔවුන් සමග විවාහ වීමටත් කැමැත්තක් දක්වන බව.( ආබාධ සහිත කාන්තාවන්ගේ ප්‍රශ්නාවලියේ 01 වන ප්‍රශ්ණය , ආබාධ සහිත තරුණයින්ගේ ප්‍රශ්නාවලියේ01 ,02, 03 වන ප්‍රශ්ණ, )

10. ආබාධ සහිත ප්‍රජාවට දාව උපදින දරුවන් ආබාධ සහිත වීමේ ප්‍රතිශතය වැඩිය යන මතය ප්‍රතිචාරකයින්ගේ පිළිතුරු තුලින් ගම්‍යවීම. ( ආබාධ සහිත තරුණයින්ගේ ප්‍රශ්ණාවලියේ 05 ප්‍රශ්ණය )

11. ආබාධ සහිත තරුණ තරුණියන් පිළිබඳ ආබාධ සහිත නොවන ප්‍රජාව තුල ඇත්තේ අනුකම්පාව මූලික කරගත් ආකල්පයකි. ( ආබාධ සහිත තරුණයින්ගේ ප්‍රශ්නාවලියේ 07 වන ප්‍රශ්නය )

12. තාරුණ්‍යයේ මූලිකම ලක්ෂණයක් වන ප්‍රේමණීය බව ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ජීවිත තුලින් සැලකිය යුතු ප්‍රතිශතයකින් ඈත් වී ඇති බව. ( ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ප්‍රශ්නාවලියේ සහ ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ප්‍රශ්නාවලියේ 1,2 සහ 3 යන ප්‍රශ්න වලට සපයා ඇති පිළිතුරු වල ප්‍රතිශතයන් නිරීක්ෂණය කල විට එය තහවුරු වේ. )

## <u>ආබාධ සහිත නොවන තරුණ ප්‍රජාව පිළිබඳව මෙම සමීක්ෂණයට අනුව ඵලදායී හැකි නිගමන.</u>

01. ආබාධ සහිත තරුණ ප්‍රජාව පිළිබඳ හැඟීම හා අවබෝධය ආබාධ සහිත නොවන තරුණ ප්‍රජාවෙන් හරි අඩකට අසන්න ප්‍රමාණයකට නොමැති වීම. ( ආබාධ සහිත නොවන තරුණ තරුණියන්ගෙ ප්‍රශ්නාවලියේ 01 හා 02 වන ප්‍රශ්නයට ලබා දී ඇති ප්‍රතිචාර අනුව.)

02. ආබාධ සහිත තරුණ තරුණියන්ගේ විවාහ අවශ්‍යතාවය පිළිබඳ ආබාධ සහිත නොවන තරුණ තරුණියන් තුල ධනාත්මක අදහසක් නොමැත. ආබාධ සහිත තරුණ ප්‍රජාවේ වැඩි පිරිසක් කැමැත්ත ප්‍රකාශකර තිබෙන්නේ ආබාධ සහිත නොවන තරුණ තරුණියන් හා විවාහ වීමටය. නමුත් ඊට හාත්පසින් වෙනස් වූ ප්‍රතිචාරයක් ආබාධ සහිත නොවන තරුණ තරුණියන්ගෙන් ලැබී ඇත. ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 03 හා 04 ප්‍රශ්ණ සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව)

03. ආබාධ සහිත පුද්ගලයින් හා ආබාධ සහිත නොවන පුද්ගලයින් ලිංගිකව එකතු වීමෙන් බිහි වන දරුවන් ආබාධ සහිත වන බවට ඇති මතය ආබාධ සහිත නොවන තරුණ තරුණියන් තුල දක්නට ලැබීම. ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 04 හා 05 ප්‍රශ්ණ සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව)

04. ආබාධ සහිත පුද්ගලයින්ට පවුල් ජීවිතය සාර්ථක කරගැනීමට තම පවුල සඳහා දැක්විය හැකි දායකත්වය ඉතා අඩු මට්ටමක ඇති බවට ආබාධ සහිත නොවන තරුණ්‍ය තුල මතයක් පැවතීම. ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 06 වන ප්‍රශ්ණනය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

05. ආබාධ සහිත පුද්ගලයින් අන්තකර්රණය පිළිබඳ ආබාධ සහිත නොවන තරුණියන්ට ඇති දැනුම හා වැටහීම හොඳ මට්ටමක ඇති නමුත් ආබාධ සහිත නොවන තරුණයින් ඒ පිළිබඳ දරන මතය

අවම මට්ටමක පැවතීම. . ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 06 වන ප්‍රශ්ණනය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

06. ආබාධ සහිත තරුණ තරුණියන් පිළබඳව ආබාධ සහිත නොවන තරුණ තරුණියන් තුල ඇති ආකල්ප ඍනාත්මක ස්වරූපයක් ගැනීම. ඔවුන් දක්වා ඇති ප්‍රතිචාර වලින් නිරූපනය වන්නේ ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ දැඩි අනුකම්පා සහගත ස්වරූපයකින් සිතන බවය. (අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 07 වන ප්‍රශ්ණනය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

07. ජාතික ප්‍රතිපත්තියේ ඇති ශ්‍රී ලංකාව තුල පිළිගත් ආබාධ සහිත භාවයන් පිළබඳ ආබාධ සහිත නොවන තරුණ ප්‍රජාවට ඇති දැනුම අවබෝධය අඩු මට්ටමක ඇති බව. . ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 08 වන ප්‍රශ්ණනය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

08. ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ සමාජයේ ඇති දුමර්ත (සෘණාත්මක ආකල්ප) පිළිබඳ ආබාධ සහිත නොවන තරුණ තරුණියන්ට මනා වැටහීමක් ඇති බවත් එම මතයන් තුලින් ඔවු ආබාධ සහිත ප්‍රජාව වෙත සිය අවධානය යොමු කිරීම. . ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 09 වන ප්‍රශ්ණනය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

09. ආබාධ සහිත ප්‍රජාවගේ පවුල් සංස්ථාව නගා සිටුවීමට ඔවුනගේ ආථර්කමය හැකියාවන් වධර්නය කිරීම වැදගත් බව. . ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 10 වන ප්‍රශ්ණනය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

10. ආබාධ සහිත වේවා හෝ නොවේවා ලංකාවේ පවුල් මුහුණදෙන ප්‍රධානතම අභියෝගය ආථර්ක අපහසුතා බව නීරික්ෂණය වීම . ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 10 සහ 11 වන ප්‍රශ්ණන සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

11. ආබාධ සහිත හෝ ආබාධ සහිත නොවන පවුල් ලාංකික සමාජය තුල මුහුණ දෙන ප්‍රධානතම අභියෝග බොහෝදුරට සමාන බවත් ඒවා ආබාධ සහිත පවුල වලට පමණක් විශේෂ වූ ඒවා නොවන බවත් තහවුරු වීම. . ( අබාධ සහිත නොවන තරුණ තරුණියන් සඳහා වූ ප්‍රශ්නාවලියේ 10 සහ 11 වන ප්‍රශ්ණන සඳහා ලබා දී ඇති ප්‍රතිචාර අනුව )

## <u>පොදු ප්‍රශ්නාවලියේ හදුනාගත් පොදු නිගමනයන්.</u>

01. ලිංගිකත්වය පිළිබඳ ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව තුල නිරවුල් දැනුමක් හා අවබෝධයක් නොමැති බව. මෙම අංශය යටතේ විමසා තිබූ සෑම ප්‍රශ්නයකටම පාහේ වැඩි ප්‍රතිචාර ප්‍රමාණයක් හිමි වී තිබූ පිළිතුරේ අගයට ආසන්න අගයක් අනෙක් පිළිතුරු දෙකෙ ප්‍රතිචාරයන් එකතු කිරීමෙන් ලැබේ . එයින් එලබිය හැකි නිගමනය වන්නේ එම ප්‍රශ්ණය පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇති පිරිසට ආසන්න පිරිසක් එම කරුණ පිළිබඳ වැරදි අවබෝධයෙන් සිටින බවයි.

02. ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව තුල ලිංගිකත්වයේ යම් කාරණා සම්බන්ධයෙන් තරුණයන් හා තරුණියන් අතර වෙනස් මතයක් පිළිබිඟු වීම. මෙම ප්‍රශ්ණාවලියේ ඇතැම් ප්‍රශ්ණ සඳහා තරුණයන් එක් මතයක් දරණ විට ඒ සම්බන්ධ ප්‍රතිවිරුද්ධ මතයක් තරුණියන් විසින් ප්‍රකාශ කිරීම දක්නට ලැබේ.

03. තරුණියන් ලිංගිකත්වය පිළිබඳ කතා කිරීමට මැලි කමක් දක්වන බව. මෙම ප්‍රශ්නාවලියේ නොදනී යනුවෙන් සලකුණු කර ඇති පිරිසෙන් වැඩි ප්‍රතිශතයක් කාන්තාවන්ය. එය ඔවුන් ලිංගිකත්වය පිළිබඳ දක්වන උනන්දුව අඩුකම නිසා සිදු වන කාරණාවකි.

04. ලිංගිකත්වය පිළිබඳ දැනුම පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ට අඩු බව. නොදනී යන පිළිතුර ලබාදුන් අයගෙන් වැඩි ප්‍රතිශතය කාන්තාවන් වීම.

05. ලිංගිකත්වය පිළිබඳ දැනුම ආබාධ සහිත කාන්තාවන්ට අඩු බව. නොදනි යුනුවෙන් පිළිතුරු ලබා දී ඇති කාන්තාවන්ගේන් වැඩි ප්‍රතිශයක් නියෝජනය කරන්නේ ආබාධ සහිත කාන්තාවන්ය.

06. ලිංගිකත්වයේ යම් කාරණා සම්බන්ධයෙන් දරණු ලබන මතයන් පිළිබඳ තරුණ තරුණියන් තුල සමාන මතයක් දක්නට ලැබීම.

07. ආබාධ සහිත පුදගලයින් දාව උපදින දරුවන් ආබාධ සහිත දරුවන් බ වට පත්වේයැයි යන මතයට වැඩි ප්‍රතිශතයක් එකග වී ඇත්තේ කාන්තාවන්ය.. ඉන් වැඩිම ප්‍රතිශතය නියෝජනය කරන්නේ ආබාධ සහිත කාන්තාවන්ය.

## <u>සමීක්ෂණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විග්‍රහය</u>

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්න ජීව විද්‍යාත්මක කාරණාවක් නොව එය සංස්කෘතිකමය කාරණාවකි. බොහෝ අවස්ථාවල sex හා gender පිළිබඳ අදහස් පටලැවිලි සහගත වූ අවස්ථා දක්නට ලැබේ. ඒ අනුව sex යන්න

ස්ත්‍රී හා පුරුෂ වශයෙන් හිමි වන ජීවවිද්‍යාත්මක කාරණාවකි. නමුත් gender තුල මෙය ඇත්තේ ස්ත්‍රීත්වය හා පුරුෂත්වය යනුවෙනි.

ඒ අනුව ඒ හා බැඳුනු යම යම් කාරණා මෙම සමීක්ෂණය තුලදි අපට හමු වේ.

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සංවධර්නය හා සෘජුව සම්බන්ධ වේ. ඒ අනුව මෙම සමීක්ෂණයේ නියැදීන් තුල ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව දක්නට ලැබෙන බොහෝ වෙනස්කම් අපට හදුනාගත හැක. මෙය gender discrimination යනුවෙන් හදුන්වනු ලැබේ . මෙම කාරණාව සමාජය තුල, පවුල තුල , ආයතන තුල දක්නට ලැබේ.

මෙම කාරණාව අපට මෙම සමීක්ෂණය තුලින් හෙලි වන අවස්ථාවක් වන්නේ විවාහය පිළිබද විමසා ඇති ප්‍රශ්ණාවලිය තුලදි ඒ පිළිබදව ස්ත්‍රී පුරුෂ වශයෙන් ඒ වගේම ආබාධ සහිත නොවන හා ආබාධ සහිත වශයෙන් , ආබාධ සහිත තරුණයින් හා ආබාධ සහිත නොවන තරුණියන් යනාදි වශයෙන් නොයෙක් පරස්පර විරෝධි අදහස් හදුනාගත හැක .

තවද අපට හමුවන ප්‍රධාන කාරණාවක් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමාජානුයෝජනය යන්නයි. මෙය වඩාත් පැහැදිලි වන්නේ ලිංගිකත්වය පිළිබද ඒ ඒ කණ්ඩායම් තුල ඇති දැනුම එකිනෙකට වෙනස් වීම තුලිනි. ඒ අනුව එලබිය හැකි නිගමනය වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව මෙම ලිංගිකත්වය පිළිබද දැනුම විවිධ වන බවත් ඒ තුලින් සමාජය තුල විවිධ පරතරයන් නිමර්ාණය වී ඇති බවත්ය.

එසේ මෙම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව ආථර්ික කාරණා තීරණය වන ආකාරය අපට මනාව මෙම සමීක්ෂණය තුලින් වැටහේ. ඒ අතර ආබාධ සහිත කාන්තාවන්ගේ ආථර්ික හැකියාව හා ඔවුන්ට ඇති අවස්ථා පිළිබද බොහෝ ගැටළුකාරී තත්වයන් මෙම සමීක්ෂණය තුලින් අනාවරණය වී තිබේ.

මේ ආකාරයට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව ගොඩනැගෙන සමාජ පරතරයන් රාශියක් මෙම සමීක්ෂණය තුලින් අනාවරණය වේ.

- ඇමුණුම්, : සමීක්ෂණයේ දත්ත ඒකරාශි කිරීම සදහා යොදාගත් ප්‍රශ්ණාවලිය